

# රූපභේදප්‍රකාශිනිය.



# රූපභෙදප්පකාසනීය.

ජම්බුධජ නම් මහාස්ථවිරපාදයන් විසින්
කරනලදී.

## වැලිතොට

විද්‍යොදය විද්‍යාලයාධිස්වර
අමරපුරගණප්‍රධාන සඞ්ඝනායක
සකල ශෙරුතත්කාන මාසනාභූත
සද්ධාන වංශ
උක්කට්ඨ මහාතිස්ස අරියවංසාලඞ්කාර
ඤාණතිලකනායකස්ථවිරපාදයන්විසින්
කරනලද
සන්නසහිතයි.

ජූලියස්දසිල්වාවිජයකුලතිලකඉදිරිසිංහ
අප්පුහාමින් විසින්
වැලිතොට
විද්‍යාරත්නාකරයන්ත්‍රාලයෙහි
මුද්‍රණයකරවනලදී.

බු. 2451.
ක්‍රි 1907.

# සංඥාපනය.

රූපභෙදප්‍රකාශනිය — මෙම ග්‍රන්ථය මීට අවුරුදු සියයකට පමණ ඉහත බුරුමරටේ බොබොදභීනම් ග්‍රාමයෙහි උපන් ''ජම්බුධජ'' නම් මහාස්ථවිරපාදයන් වහන්සේවිසින් කරනලද්දේයි — මුන්වහන්සේ අපගේ උපාධ්‍යායවූ සාහිත්‍ය ප්‍රවචනයෙහිද ශබ්දශාස්ත්‍රයෙහිද ඉතාදක්‍ෂයෙකුවූ දහස්ගණන් ශාසනික කුලපුත්‍රයන්ගේ ආචාර්‍යයවූ ''උක්කංවංසමාල'' මහාසංඝනායකස්ථවිරපාදයන්වහන්සේගේද ආචාර්‍යයවූයේයි — මුන්වහන්සේද අමරපුර සමාගම ලක්දිව පිහිටුවීමේ මූලාරම්භකවූ ඤාණාභිවංස ධම්මසේනාපති මහාධම්මරාජාධිරාජගුරු සංඝරාජ මහාස්ථවිර පාදයන්වහන්සේද යථොක්ත අපගේ උපාධ්‍යායයන්වහන්සේගේ ප්‍රව්‍රජ්‍යාචාර්‍යයවූ ඤාණාභිධම්මමහාස්ථවිරපාදයන්වහන්සේද එක කාලයෙහි විසූ පඬිවරයෝ වූහ - ඔවුන්ගෙන්ද මුන්වහන්සේ ඉතා සම්භාව්‍යලෙස පිළිගණුලැබිය — මේග්‍රන්ථය කිරීමට ආරාධිතවූයේද එම ඤාණාභිවංස මහාස්ථවිර පාදයන්වහන්සේ — මේග්‍රන්ථය මුන්වහන්සේලා නවක අවස්ථාවෙහිදී කරනලද බව කියහැක්කේයි —

මුන්වහන්සේවිසින් කරනලද බොහෝපොත් ඇතත් ඉන්අපටලැබීතිබෙන්නේ නිරුක්තිභෙද සංග්‍රහව — සංවණ්ණනානයදීපනිය මෙමරූපභෙදප්‍රකාශනිය යන පොත් තුණපමණෙකි —

මෙය ගාථා එක්සිය පසළොසකින් යුක්තවූයේයි — ද්‍රව්‍ය,ධාතු,ආඛ්‍යාතක්‍රියාවිශෙෂවිභාගදැනගැන්මට මෙය ඉතා උපකාරවන්නේයි — මෙපොත ලක්දිවද නොමැත්තේයි - මීට ටීකාවක්ද නැත්තේයි — මෙය අප සමීපයෙහි වසන ඉන්ද්‍රිය නැමැති උගත් බුරුමභික්ෂුවගෙන් ලැබ අපගේ දැඩිමිත්‍රවූ කොස්ගොඩ සඹාතිස්ස මහාස්ථවිරයන්විසින් ව්‍යාඛ්‍යාවක් කළමැනවැයි ආරාධිතවූහෙයින් මගේ ප්‍රියශිෂ්‍යවූ ඤාණවාස නැමැත්තන්සමග යම්යම්තැන් ගැණ සාකච්ඡාකරමින් ලියානිමකරනලද්දේයි —

ආඛ්‍යාතක්‍රියා නාම දැනගැන්මට මෙය ඉතා ප්‍රයෝජන පොතක්බැවි වැඩිදුරටත් ප්‍රකාශකරමි —

අමරපුර ශ්‍රී ප්‍රධාන නායක ස්වාමීන්-
සකල ලෙ‍ාකාරුත් නිකාගම්ආසහාය භූතසඳහාන වශිය
උපාධ්‍යායමහා. තිස්ස අභියලංසාලඞ්කාර
ගුණතිලක නායක සම්පාදනය කළ මහා ... විසින්
කරනලදුව දැනට මුද්‍රණය කරනලද

# පොත්.

1 ඒකක්ඛරකොස විස්තර සන්නය
2 ශබ්දබින්දු විස්තර සන්නය.
3 මුඛමත්තදීපනි විස්තර සන්නය.
4 කච්චායනසාර විස්තර සන්නය.
5 කාරිකා විස්තර සන්නය.
6 ශබ්දජාති ප්‍රකාශ විස්තර සන්නය.
7 ගන්ධාභරණ විස්තර සන්නය.
8 වච්චවාචක විස්තර සන්නය.
9 වාචකොපදෙශ විස්තර සන්නය.
10 විභත්ත්‍යර්ථ විස්තර සන්නය.
11 සාසන වංසදීප විස්තර සන්නය.
12 ශබ්දාරතිලක විස්තර සන්නය.
13 රූපභෙදප්‍රකාශනී විස්තර සන්නය.
14 මොහාවතාරය—

## අමුද්‍රිතපොත්

15 සද්දත්ථභෙදචින්තා විස්තර සන්නය.
16 නිරුක්තිභෙදසඞ්ග්‍රහසන්නය.
17 ගන්ධට්ඨිවිස්තර සන්නය.
18 ශ්‍රී ගම්මුද්ගල සන්නය.
19 බාලාවතාර ක්‍රියාවන සන්නය.
20 නිරුක්තිරත්නාකරය.
21 බෙදප්‍රකාශනිය.
22 සංවණ්ණනානය දීපනී සන්නය.

## ප්‍රාරබ්ධපොත්

23 මහාශබ්දනීති සන්නය.
24 ආඛ්‍යාත භාෂා සද්ධර්ථය.
25 රූපභෙදය—

සන්න සහිත

# රූපභෙදප්පකාසනිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

1 යො රූපභෙද මසෙසෙසි නිඛිලං භුවනන්තරෙ
අනන්තඤාණො සම්බුද්ධො සමෙ සීසෙ තථාගතො.

2 වහන්ති ධම්මමාලං යෙ වට්ටදුක්ඛා අපෙන්ති තෙ
පාපුණන්ති තතො මොක්ඛං සද්ධම්මො මත්ථකෙ සමෙ,

3 උපට්ඨහන්ති යෙ සඞ්ඝං සබ්බාය භවසම්පදං
ලද්ධා තෙ වට්ටදුක්ඛස්මා අපෙන්ති සසිරෙ මම.

4 සබ්බම්මවිතයෙ සද්ද සත්ථෙ යො සික්ඛති මමං
පණ්ඩිතො ඝඳුමාරාම මහාථෙරො සමෙ සිරෙ.

5 මරම්මවිසයෙ උක්කා වංසමාලාභිධානවා
උපජ්ඣායො මමං ආසි මහාථෙරො මහාමති.

6 තස්සාචරියතං පත්තො ජම්බුධජොති පාකටො
මහාථෙරො තෙපිටකො සද්දසත්ථවිසාරදො.

7 ගම්භීරත්ථ සමපන්නං ආඛ්‍යාතම්බුධි පච්චරිං
රූපභෙදප්පකාසනිං අකා පාළිනයානුගං.

8 ව්‍යත්තො මරම්මිකො ධීමා ථෙරො ඤාණින්ද නාමකො
සිස්සො තා ණාගකංසෙන මය්හ මාතුල මාවසී

9 සො දිසි වණ්ණං තං ගන්ථං සිස්සුගග ඤ්ඤාපකෙ අඤ්ඤං
සුන්දරානි කාථානං සද්ධාසිස්ස නාපස්සිතො.

10 තදා තෙනෙව කාතබ්බා ව්‍යාඛ්‍යා අස්සාති යාචිතො
ඤාණාභාස සමයොජන මම්මෙ ගතාභාසිතා සම්මං.

1 මහාබුද්ධිහි දුත්තිණ්ණං තිණ්ණං සද්දත්ථඅම්බුධිං
බුධිං බොධාය දෙසෙන්තං සෙන්තංවන්දම්අක්ඛයං.

2 නොපපන්නෙහි දුබ්බොධා බොධා විසාරදෙහි සෙවිතා
වීතා මලෙහි සඤ්ජිතතා ජිතතා වන්දම් තෙපි යෙ.

3 සද්ධම්මරසසෙවන්තං වන්තං සංසාරචාරිනං
රතං විසයනිස්සඨගං සංඝං වන්දම් ඕරසං.

---

11 සාත්ථං තත්ථං සුගම්භීර ට්ඨානං සුට්ඨු සමාලපං
කස්ස මස්සා නිච්ඡයිත්වා වණ්ණෙස්සං සාය නිරුත්තියා.

12 දොසො යොත්‍ථ භවෙ කොචි මමඤ්ඤාණපමාදජො
සොධෙන්තු තස්ස ධීරාච මෙත්තා නාසෙසු කුබ්බිනො.

---

1 මහාබුද්ධිහි, මහත්නුවණැත්තාවුන්විසින්; දුත්තිණ්ණං, එතරවිය නොහැක්කාවූ; සද්දත්ථඅම්බුධිං, ශබ්දාර්ථ සාගරය; තිණ්ණං, එතරකළාවූ; බොධාය, අවබොධය පිණිස; දෙසෙන්තං, දෙශනාකරන්නාවූ; අක්ඛයං, නිර්වාණයට; සෙන්තං, පමුණුවන්නාවූ; බුද්ධං, සර්වඥයන්වහන්සේ; වන්දම්, වඳිමි ―

2 නොපපන්නෙහි, පුරුදු නොකරනලද්දවුන් විසින්; දුබ්බොධා, අවබොධකළනොහැක්කාවූ; විසාරදෙහි, විඥයන් විසින්; බොධා, අවබොධකළහැක්කාවූ; සෙවිතා (ඔවුන් විසින්ම) සෙවුනාලද්දාවූ; මලෙහි, මලයන්; වීතා, පහවූ; ජිතතා, සිත්යුතුවූ ක්ලේශයන්; සඤ්ජිතතා, අභිශයින් දිනලද්දාවූ; යෙ, යම්සව්ලොකොත්තර ශ්‍රී ධර්මකෙණෙක් ඇද්ද; තෙපි, එධර්මයන්ද; වන්දම්, වඳිමි ―

('ජිතතා' යනු කර්මාර්ථයෙහිවූ ප්‍රථමාය)

3 සද්ධම්මරසසෙවන්තං, සද්ධර්මරසය සෙවනය කරන්නාවූ; සංසාරචාරිනං, තෘෂ්ණාව; වන්තං, වමනයකළාවූ; ඇරිතං; (ක්ලෙශ) ශාන්තියෙහි; විසයනිස්සඨගං, විෂයයන් මිදුනාවූ; නොයෙකොත්, විෂයයන නොඇලුනාවූ; ඕරසං, ඖරසපුත්‍රවූ; සංඝං, (අෂ්ටාර්යපුද්ගලසංඛ්‍යාත) සංඝයාවහන්සේ; වන්දම්, වඳිමි ―

4 එවං වත්ථුප්පණාමස්ස තෙජසා සබ්බුපද්දවෙ
හිත්වාහං කරිස්සාමි රූපභෙදප්පකාසනිං.

5 විනයෙ විනයඤ්ඤූනං නයගාහාය සාධුකං
චතුම්මහාපදෙසං තං අභාසි නායකො යථා.

6 සද්දෙසු සද්දවිඤ්ඤූනං නයගාහාය සාධුකං
මහාපදෙසසුත්තං තං භාසි කච්චායනො තථා.

7 යථා තස්මුපනිස්සාය සද්දිකා නිච්ඡයුං බහුං
තථා සංඛෙපසු විඤ්ඤූනං නිච්ඡිතො උද්ධරීයතෙ.

---

4 එවං, මෙසේ; අහං, මම; වත්ථුප්පණාමස්ස, වස්තු (ත්‍රය) ප්‍රණාමයාගේ; තෙජසා, තේජසකාරණකොට ගෙණ; සබ්බුපද්දවෙ, සියලුඋපද්‍රවයන්; හිත්වාන, හැර රූපභෙදප්පකාසනිං, රූපභෙදප්‍රකාසනී නම් ප්‍රකරණයක්; කරිස්සාමි, කරන්නෙමි—

5 යථා, යම්සේ; නායකො, සර්වඥයන්වහන්සේ; විනයෙ, විනයෙහි; විනයඤ්ඤූනං, විනයදන්නවුන්ට; සාධුකං, යහපත්කොට; නයගාහාය, නයගැන්මපිණිස; තං චතුම්මහාපදෙසං, ඒ සතරමහාප්‍රදෙශය; අභාසි, වදාළසේක—

6 තථා, එසේම; කච්චායනො, කච්චායනස්ථවිරයන්වහන්සේ; සද්දෙසු, ශබ්දයන්හි; සද්දවිඤ්ඤූනං, ශබ්දදන්නවුන්ට; සාධුකං, යහපත්කොට; නයගාහාය, නයගැන්මපිණිස; තං මහාපදෙසසුත්තං, ඒමහාප්‍රදෙශසූත්‍රය; අභාසි, වදාළසේක—
(මහාප්‍රදෙශසූත්‍රනම් සංඥා අධිකාර පරිභාෂා විධිසූත්‍රයි)

7 යථා, යම්සේ; සද්දිකා, ශාබ්දිකාචාර්යයෝ; තංච, ඒ සතරමහාප්‍රදෙශයද; උපනිස්සාය, උපාශ්‍රයකොට; බහුං, බොහෝවූ විනිශ්චය; නොහොත් බොහෝ කොට; නිච්ඡයුං, නිශ්චයකළාහුද; තථා, එසේම;

---

7 "නිච්ඡිංසු සද්දිකා බහු" යි පොතෙක

8 වත්තමාන සමීපම්හි තබ්බොහාරූපචාරතො
වත්තමානා අතීතෙපි කුතො ත්වං භික්ඛු ගච්ඡසි.

9 යාව පුරෙ පුරා යොගෙ වත්තමානා අනාගතෙ
යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති
පුරෙ දිප්පත්‍ය අධම්මො පුරා විස්සති ආදිව~~~

10 අවස්සම්භාවියෙ කංසා නියමෙත්ථ සවනාගතෙ
ඉඤ්ජනා දුක්ඛක්ඛයමෙමන ධුවං බුද්ධො භවාමහං

---

සත්ථෙසු, ශාස්ත්‍රයන්හි; විඤ්ඤූහි, විඥයන්විසින්; නිච්ඡිතො, නිශ්චයකරනලද එනිශ්චයතෙම්; උදීරිතො, උදුරනලැබේ~~~

8 වත්තමානා, වර්තමානවිභක්තිහොමෝ; තබ්බොහාරූපචාරතො, තද්ව්‍යවහාරයට උපචාරභාවයෙන්; වත්තමානසමීපම්හි, වර්තමානයට සමීපවූ; අතීතෙ අපි, අතීතයෙහිද වේ; කුතො ත්වං භික්ඛු ආගච්ඡසි, කුතො ත්වං භික්ඛු ආගච්ඡසි යනු උදාහරණයි~~~

("භික්ඛු, මහණ! ත්වං, තෝ, කුතො, කොහිසිට; ආගච්ඡසි, ආයේහිද)

9 යාව පුරෙ පුරා යොගෙ, යාව පුරෙ පුරා යන නිපාතයන්ගේ යොගයක්ඇතිකල්හි, වත්තමානා, වර්තමානවිභක්තිහොමෝ; අනාගතෙ, අනාගතකාලයෙහි වේ, යාවදෙව අනත්ථාය ඤත්තං බාලස්ස ජායති, පුරෙ දිප්පති අධම්මො පුරාවිස්සති (ඉති) යාවදෙව--පෙ-- විස්සති යන; ආදිව, මේආදීන්ද නිදර්ශනයි~~~

(බාලස්ස, බාලයාගේ, ඤත්තං, දැනගැන්ම; යාවදෙව, යම්තාක් පමණකල්ම; අනත්ථාය, අනර්ථපිණිස; ජායති, වන්නේද—අධම්මො, අධර්මයතෙම; දිප්පති, බබලන්නේද; පුරෙ, ඉන්පූර්වයෙහි—විස්සති, විස්නේද; පුරා, ඉන්පූර්වයෙන)

10 අවස්සම්භාවිය, අවශ්‍යංභාවියාර්ථය; එකංස, එකකොට්ඨාසාර්ථය; අනියමෙත්ථසු, අනියමාර්ථය යන මේ

---

10 "එකංසාවස්සං භාවීහා නියමෙත්ථ
වනාගතෙ" ති පොත්ථකෙ—

11 නිරයං නූන ගච්ඡාමි එත්ථ මෙ නත්ථි සංසයො
මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා

12 කදා කරහියොගෙ වා වත්තමානා අනාගතෙ
කදා ගච්ඡති භද්දන්තෙ කරහි ගච්ඡතීති ච

---

අභිධීයත්ති; අනාගතෙ, අනාගතකාලයෙහි (වර්තමාන විභක්ති) වේ; ඉම්නා පුඤ්ඤකම්මෙන ධුවං බුද්ධො භවාමහං, ඉම්නා—පෙ—භවාමහං යනුද

11 නිරයං නූන ගච්ඡාමි නත්ථි මෙ එත්ථ සංසයො, නිරයං—පෙ-සංසයො යනුද, මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා, මනසා—පෙ—කරොතිවා යනුද උදාහරණයි

("ඉම්නා පුඤ්ඤකම්මෙන ධුවං බුද්ධො භවාමහං" යනු අවස්සංභාවිත්‍යාර්ථයෙහි උදාහරණයි—අහං, මම; ඉම්නා පුඤ්ඤකම්මෙන, මේ පුණ්‍යකර්මයකරණකොට ගෙණ; ධුවං, ඒකාන්තයෙන්; බුද්ධො භවාමි, බුදුවන්නෙමි—"නිරයං නූන ගච්ඡාමි නත්ථි මෙ එත්ථ සංසයො" යනු ඒකාංශාර්ථයෙහි උදාහරණයි—නූන, ඒකාංශයකින්; නිරයං, නරකයට ගච්ඡාමි; යන්නෙමි, එත්ථ, මෙහි; මෙ, මට; සංසයො, සැකයෙක්; නත්ථි. නැත්තේය—"මනසා—පෙ—කරොතිවා" යනු අතීතාර්ථයෙහි උදාහරණයි-චෙ, ඉදින්; පදුට්ඨෙන, දූෂිතවූ, මනසා, සිතින්; භාසතිවා, කියන්නේනම්හෝ; කරොතිවා, කරන්නේනම්හෝ)

12 වා, අනික්කුවයෙක් කියනුලැබේ; කදාකරහියොගෙ, කදා කරහි යන නිපාතයන්ගේ යොගයක් ඇතිකල්හි; වත්තමානා, වර්තමානවිභක්තීනොමෙර්; අනාගතෙ, අනාගතයෙහි වේ; කදා ගච්ඡති භද්දන්තෙ, කදාගච්ඡති භද්දන්තෙ යනුද; කරහි ගච්ඡති ඉතිච, කරහි ගච්ඡති යනුද උදාහරණයි

(භද්දන්තෙ, වහන්ස!; කදා. කවරකාලෙක්හි; ගච්ඡති, යන්නේද; කරහි, කවරකාලෙක්හි; ගච්ඡති, යන්නේද)

13 නනු නනු උපපදෙ පුච්ඡස්ස පටිභාසනෙ
වත්තමානා අතීතෙපි දෙවදත්ත අකා කටං—

14 නනු කරෙමි සොහි ම දෙවදත්ත අකා කටං
සො අහං න කරෙමිති නු කරෙමි අහං ඉච්ච
සමත්ථාඥප්පකාසෙව තද්‍ය නභවතී හය්‍යං—

13—14 නනු නනු උපපදෙ, නනුය නය නුය යන නි
පාතයන් උපපදකොට ඇතිකල්හි; පුච්ඡස්ස, විචාළා
හට; පටිභාසනෙ, උත්තරදීමෙහි, වත්තමානා, වර්තමා
නවිභක්තිය; අතීතෙපි, අතීතකාලයෙහිද වේ; දෙව
දත්ත අකා කටං නනුකරෙමිසොඉති ච, දෙවදත්ත අකා
කටං නනු කරෙමි සො යනුද; දෙවදත්ත අකා කටං
සො අහං න කරෙමි ඉති, දෙවදත්ත අකා කටං සො
අහං න කරෙමි යනුද; අහං නු කරෙමි ඉති ච, අහං නු
කරෙමි යනුද උදාහරණයි—සමත්ථාඥප්පකාසෙව, අනී
තාර්ථයාගේ ප්‍රකාශකිරීමක් ඇතිකල්හිද (වර්තමාන විභ
ක්ති) වේ; භය්‍යං තද්‍ය නභවති, හය්‍යං තද්‍ය නභවති යනු
උදාහරණයි.—

("දෙවදත්ත කටං අකාසි සො කරෙමි නනු" යනු නනු
ශබ්දයාගේ යොගයෙහි උදාහරණයි—දෙවදත්ත, දෙව
දත්තය! කටං, අකාසි, කළාලක් කෙළෙහිද; සො, ඒම
ම; කරෙමිනනු, කෙළෙමිනොවේද—"දෙවදත්ත අකා
කටං සො හං න කරෙමි" යනු න ශබ්දයාගේ යොග
යෙහි උදාහරණයි—දෙවදත්ත, දෙවදත්තය! කටං, කළා
ලක්; අකාසි, කෙළෙහිද, සො අහං, ඒ මම; න කරෙ
මි, නොකෙළෙමි—"අහං නු කරෙමි" යනු නු ශබ්ද
යාගේ යොගයෙන් උදාහරණයි—අහං, මම; කරෙමි
නු, කෙළෙම්ද—"අකාසි" යනදෙතැන්හිම සිහට ලොප්-

13 පුච්ඡස්ස පටිවචනෙ-දෙවදත්තා කාසි කටං—
14 දෙවදත්ත, කාසිකට, නකරෙමි සො හං නාහිච, භය්‍යං
තද්‍ය නභ:ති —ති පොත්කෙ

15 ආණත්ත සිට්ඨ අනොකාස සපථෙ විධි යාචනෙ
නිමන්තනා මන්තණ ජ්ඣිට්ඨ සංපුච්ඡා පත්ථනාසුච—

16 ගාමං ගච්ඡතු ආණත්තායං ආසිට්ඨෙ හොතු තෙ සුඛං
චොර ඡිජ්ජන්තු අනොකාසෙ සපථෙ සෙතු එකිකා.

17 පුඤ්ඤං කරොතු විධිම්හි තාගං මෙ දෙහි යාචනෙ
නිමන්තනෙ ධිවාසෙතු ආමන්තණෙ පසාසතු.

---

“භායං න භවති තදා” යනු අභිනාපියෙහි උදාහරණයි- තදා, එකල්හි; භායං, බිය; න භවති, නුවූයේය)

15 ආණත්ති, නියොගය, ආසිට්ඨ, ආශංසනය; අනොකාස, ආක්‍රොශය; සපථෙ, දිවිරීමය යන මෙහිද; විධි, විධිය; යාචනෙ, ඉල්වීමය යන මෙහිද; නිමන්තනා, නිමන්ත්‍රණය; ආමන්තණ, ආමන්ත්‍රණය; අජ්ඣිට්ඨ, අධ්‍යෙෂණය; සංපුච්ඡා, විචාරීමය; පත්ථනාසුච, ප්‍රාර්ථනාය යන මෙහිද (පඤ්චමීවිභත්ති) වේ—

16 ගාමංගච්ඡතු, ගාමංගච්ඡතුයනු; ආණත්තායං, නියොගාර්ථයෙහිවේ; හොතු තෙ සුඛං, හොතු තෙ සුඛං යනු; ආසිට්ඨෙ, ආශංසනයෙහිවේ; චොරාඡිජ්ජන්තු, චොරාඡිජ්ජන්තු යනු; අනොකාසෙ, ආක්‍රොශයෙහිවේ; සෙතු එකිකා, සෙතු එකිකා යනු; සපථෙ, දිවිරීමෙහිවේ—

(ගාමං, ගමට; ගච්ඡතු, යේවා—තෙ, තට; සුඛං, සුව; හොතු, වේවා—චොරා, සොරු; ඡිජ්ජන්තු, සිඳ්දත්වා- එකිකා, හුදකලාව, සෙතු, සයනයකෙරේවා)

17 පුඤ්ඤං කරොතු, පුඤ්ඤං කරොතු යනු; විධිම්හි, විධියෙහිවේ; තාගං මෙ දෙහි, තාගං මෙ දෙහි යනු; යාචනෙ, ඉල්වීමෙහිවේ; අධිවාසෙතු, අධිවාසෙතුයනු; නිමන්තණෙ, නිමන්ත්‍රණයෙහිවේ; පසාසතු, පසාසතුයනු; ආමන්තණෙ, ආමන්ත්‍රණයෙහිවේ—

---

15 සපථෙයාචනෙ විධි—
17 යාචනෙ දෙහි මෙ තාගං, පුඤ්ඤං කරොතු විධිම්හං-පසාසතු ආමන්තණෙ” ති පොත්ථකෙ.

18 ධම්මං දෙසෙතු අජ්ඣිට්ඨො සම්පුච්ඡනෙසුණොමිකිං
පත්ථනෙ සමත්ථො හොමි ඉච්චාදි උදරීයතෙ.....

19 අනුමත්‍යං පරිකප්පෙ විධිම්හිච නිමන්තණෙ
ආමන්තණෙච අජ්ඣිට්ඨෙ සම්පුච්ඡා පත්ථනාසුච.

20 අදෙ ඛත්තිය එය්‍යාසි දුතියෙ කිමහං කරෙ
විධිම්හි ගාමං ගච්ඡෙය්‍ය භවං භුඤ්ජෙ නිමන්තණෙ.

---

(පුඤ්ඤානි, පින්; කාරෙන්තු, කෙරේවා—මෙ, මට; නාගං, හස්තියෙකු; දෙති, දෙව—අධිවාසෙතු, ඉවසාවා—පසාසතු, අනුශාසනාකෙරේවා)

18 ධම්මං දෙසෙතු, ධම්මං දෙසෙතු යනු; අජ්ඣිට්ඨෙ, අධ්‍යෙෂණයෙහිවේ; කිං සුණොමි, කිං සුණොම් යනු; සම්පුච්ඡනෙ, විචාරීමෙහි වේ; සමත්ථො හොමි, සමත්ථො හොම් යනු, පත්ථනෙ, ප්‍රාර්ථනාකිරීමෙහිවේ; ඉති ආදි, යන මේ ආදියෙනම; උදරීයතෙ, උච්චරනුලැබේ.....
(ධම්මං දෙසෙතු, දහම් දෙසාවා—කිං සුණොමි, කුමක් අසම්ද; සමත්ථො හොමි, සමර්ථ වෙම්වා)

19 අනුමත්‍යං, අනුමතිඅර්ථයෙහිද; පරිකප්පෙ, පරිකල්පාර්ථයෙහිද; විධිම්හිච, විධියෙහිද; නිමන්තණෙ, නිමන්ත්‍රණයෙහිද; ආමන්තණෙච, ආමන්ත්‍රණයෙහිද, අජ්ඣිට්ඨෙ, අධ්‍යෙෂණයෙහිද; සම්පුච්ඡා, විචාරීම්ය; පත්ථනාසුච, ප්‍රාර්ථනාය යනමෙහිද; (සප්තමී විභක්තිවේ)

20 ඛත්තිය එය්‍යාසි, ඛත්තිය එය්‍යාසි යනු; අදෙ, අදිවූ අනුමත්‍යර්ථයෙහි වේ; කිමහං කරෙ, කිමහං කරෙ යනු, දුතියෙ, දෙවන පරිකල්පාර්ථයෙහි වේ; ගාමං ගච්ඡෙය්‍ය, ගාමං ගච්ඡෙය්‍ය යනු; විධිම්හි, විධියෙහිවේ; භවං භුඤ්ජෙ, භවං භුඤ්ජෙ යනු; නිමන්තණෙ, නිමන්ත්‍රණයෙහි වේ.....

(ඛත්තිය, ක්ෂත්‍රිය!; එය්‍යාසි, එව—අහං, මම; කිං කරෙ, කුමක් කරන්නෙම්ද—ගාමං, ගමට; ගච්ඡෙය්‍ය, යන්නේය—භවං, පින්වත්තෙමේ; භුඤ්ජෙ, අනුභව කරන්නේය)

21 ආමන්තනෙ නිසීදෙය්‍ය අජ්ඣාපෙය්‍යාති අජ්ඣෙසෙ
සම්පුච්ඡනෙ කිමජ්ඣෙය්‍යං පඤ්හෙ න වසං වජෙ.

22 පෙසනෙ අතිසග්ගෙච පත්තකාලෙ ධුවෙ භවෙ.
කටං කරොතු කරෙය්‍ය සච්චං වදතු ආදිච—

23 කාලසමයවෙලාසු නිපාතෙ යම්හි සත්තමී
කාලො යං භුඤ්ජෙය්‍ය භවං සෙසෙස්වපි අයං නයො.

---

21 ආමන්තනෙ, ආමන්ත්‍රණයෙහි; නිසීදෙය්‍ය, නිසීදෙය්‍ය යනු වේ; අජ්ඣෙසෙ, අධ්‍යෙෂණයෙහි අජ්ඣාපෙය්‍ය ඉති, අජ්ඣාපෙය්‍ය යනු වේ; සම්පුච්ඡනෙ; විචාරීමෙහි; කිමජ්ඣෙය්‍යං, කිමජ්ඣෙය්‍යං යනු වේ; පඤ්හෙ, ප්‍රශ්නයෙහි; නවසංවජෙ, නවසංවජෙ යනුවේ—

(නිසීදෙය්‍ය; හින්නේය—අජ්ඣාපෙය්‍ය, හදාරවන්නේය—අහං, මම; කිං, කුමක්; අජ්ඣෙය්‍යං, හදාරන්නෙම්ද—වසං, වශයට; නවජෙ; නොයෙම්වා)

22 පෙසනෙ, යැවීමෙහිද, අතිසග්ගෙච, සැදීමෙහිද; පත්තකාලෙ, ප්‍රාප්තකාලයෙහිද; ධුවෙ, පඤ්චමීසප්තමී දෙදෙන; භවෙය්‍යුං, වන්නාහුය; කටංකරොතුකරෙය්‍ය, කටං කරොතුකරෙය්‍ය යනුද; සච්චං වදතු ආදිච, සච්චංවදතු යන ආදියද වේ—

(කටං, කලාලක්; කරොතු, කෙරේවා; කරෙය්‍ය, කරන්නේය—සච්චං, සැබවක්; වදතු, කියාවා- මෙහි "භවෙ" යනු වචනවිපර්‍ය්‍යාසයි)

23 යම්හි, යං යන නිපාතය ඇතිකල්හි; කාලසමයවෙලාසු; කාලසමයවෙලාවන්හි; සත්තමී, සප්තමීවිභක්තිවේ; කාලොයංභුඤ්ජෙය්‍යභවං, කාලොයංභුඤ්ජෙය්‍ය භවං යනු නිදර්ශනයි; සෙසෙස්වපි, සෙසුසමයවෙලාවන්හිද; අයං නයො, මේනයයි—

(භවං පින්වත්තෙමේ; යං, යමක්; භුඤ්ජෙය්‍ය, අනුභවකරන්නේද; කාලො, (එකට) කාලයවේ)

---

21 "පඤ්හෙය්‍යං නවසං ගවෙජ"

22 "වදෙය්‍යා" ති පොත්ථකෙ.

24 සත්තමී රහසත්තීසු භවං කඤ්ඤං ගහෙය්‍යව
භවං එතං මරහති කො ඉමං විජටයෙ ජටං.

25 කථඤ්හිනාමයොගෙන අතීතෙ නාගතස්සිව
කථඤ්හිනාම ත්වං මොඝ පුරිසෙවං කරිස්සසි.

26 අනියමො නාමයොගෙ මං ත්වම්පිනාම මඤ්ඤසි
තෙපිනාම තිරච්ඡානා විහරිස්සන්ති ගාරවා.

---

24 අරහසත්තීසු, අරහාපීශක්‍යාර්ථයන්හි; සත්තමී, සප්තමිවිභක්ති වේ; භවං කඤ්ඤං ගහෙය්‍ය, භවං එතං අරහතිව, භවං කඤ්ඤං ගහෙය්‍ය භවං එතං අරහති යනුද; කො ඉමං විජටයෙ ජටං, කො ඉමං විජටයෙ ජටං යනුද නිදර්ශනයි—

("භවං කඤ්ඤං ගහෙය්‍ය භවං එතං අරහති" යනු අරහාර්ථොදාහරණයි—භවං, පින්වත්තෙමේ; කඤ්ඤං, කන්‍යාවක්; ගහෙය්‍ය, ගැන්මට සුදුසුවන්නේය—භවං, පින්වත්තෙමේ; එතං, මෙයට, අරහති, සුදුසුවේ—"කො ඉමං විජටයෙ ජටං" යනු ශක්‍යාර්ථොදාහරණයි—කො, කවරෙක් තෙමේ; ඉමං ජටං, මේජටාව; විජටයෙ, අවුල්හැරීමට සමර්ථවන්නේද)

25 කථඤ්හිනාමයොගෙන, කථඤ්හිනාම යන නිපාත සමුදායාගේ යොගය හෙතුකොටගෙණ; අතීතෙ, අතීතයෙහි; අනාගතස්ස ඉව, අනාගතයාගේමෙන් ප්‍රයොගයවේ; කථංහිනාමත්වංමොඝ පුරිස එවංකරිස්සස, කථංහිනාම ත්වං මොඝ පුරිස එවං කරිස්සසි යනු නිදර්ශනයි—

(මොඝපුරිස, තුච්ඡපුරුෂය! ත්වං, තෝ; කථංහිනාම, කෙසේනම්; එවං, මෙසේ; කරස්සසි, කෙළෙහිද)

26 නාමයොගෙ, නාමයන නිපාතයාගේ යොගයෙහි; අනියමො, නියමයක්නැත්තේය; මං ත්වම්පිනාම මඤ්ඤසි, තෙපිනාම තිරච්ඡානා විහරිස්සන්ති ගාරවා, මං ත්වම්පිනාම—තෙ—ගාරවා යනු උදාහරණයි—

---

24 කඤ්ඤං ගහෙය්‍ය භාවනා—
26 ත්වම්පිනාම මං මඤ්ඤසි—හිපොත්ථකෙ

27 තිජතො ඛන්ත්‍යං චෙව නින්දායං ගුපතොතු ඡො
කිතා ඡ රොගාපනයෙ මානතො සො විමංසනෙ.

28 ණෙණයා උවණ්ණන්තෙහි ආකාරන්තෙහි පච්ඡිමා
නෙකස්සර චතුරෙවා චුරාදීහිතු පච්ඡිමා —

29 පෙසනෙ දබ්බමත්තස්ස ආණත්තෙ පඤ්චමී සියා
කිරියාය පයොගෙතු විබෙය්‍යා ණෙණයාදයො.

---

(තම්පිතාම, නොහම්; මං, මා; මඤ්ජූසි, (ලාමකයො ට) ශිනාන්ද-නෙපිතාමතිරච්ඡානා, ඒතිරිසන්හුනම්; ගාර වා, ගෞරවයෙන්, විහරිස්සන්ති, වයන්නාහුය)

27 තිජතො, තිජනිසානෙ යන ධාතුහුකෙරෙන්; ඛ න්තියං, ඉවසීමෙහි; චෙව එව, ඛප්‍රත්‍යයමවේ, ගුපතො තු, ගුපරක්ඛනෙ යන ධාතුහුකෙරෙත් වනාහි; නින්ද යං, නින්දාවෙහි; ඡො, ඡප්‍රත්‍යයවේ; කිතා, කිතරො ගාපනයනෙ යන ධාතුහුකෙරෙත්; රොගාපනයෙ, රො ගපහකිරීමෙහි; ඡ, ඡප්‍රත්‍යයවේ; මානතො, මානවීමං සනෙ යන ධාතුහු කෙරෙන්; වීමංසනෙ, විමසීමෙහි; සො, සප්‍රත්‍යය වේ —

28 උවණ්ණන්තෙහි, උවර්ණාන්තධාතුන්කෙරෙන්; ණෙ ණයා, ණෙ ණය යන ප්‍රත්‍යයෝ වෙත්; ආකාරන්තෙ හි, ආකාරාන්තධාතුන්කෙරෙන්; පච්ඡිමා, පශ්චිමවූ ණෙ ණාපය යන ප්‍රත්‍යයෝදෙදෙන වෙත්; නෙකස්සර, අනෙකස්වරධාතුහුකෙරෙන්, චතුරෙවා, ප්‍රත්‍යයෝස තරදෙනගෝ වෙත්; චුරාදීහිතු, චුරාදිධාතුන්කෙරෙන් වනාත්; පච්ඡිමා, පශ්චිමවූ ණෙ ණාපය යන ප්‍රත්‍ය යෝ දෙදෙනවෙත් —

29 දබ්බමත්තස්ස, ද්‍රව්‍යමාත්‍රයාගේ; පෙසනෙ, පැවි මක්ඇතියල්හි, ආණත්තෙ, නියොගාර්ථයෙහි; පඤ්චමී, පඤ්චමී විභක්තිය; සියා, වන්නීය; කිරියාය, ක්‍රියාවහා,

---

29 ක්‍රියායපපයොගෙතු — හිපොත්ථකෙ

30 චවග්ගාව තවග්ගානං ධාත්වන්තානං යවන්තානං
රචා තඤ්ච සප්පච්චයානං හොති යථාසාමං.

31 වුච්චතෙ මජ්ජතෙ චෙව බුජ්ඣතෙ හඤ්ඤතෙතිච
කායයතෙ දිබ්බතෙවාති, නිදස්සනං සමුද්ධටං.

32 ඛජසෙසු පරොක්ඛායං ද්වෙභාවො සබ්බධාතුනං
අප්පච්චයෙ ජුහොත්‍යාදි, ස්සපි කිච්චාදිසු ක්වචි.

33 තිතික්ඛති ජිඝච්ඡති චිකිච්ඡති ජිගුච්ඡති
තිකිච්ඡති වීමංසති බහුව බහුවූතිච.

---

පයොගෙනු, යෙදීමක් ඇතිකල්හි වනාහි; ණෙණයාද ණියා, ණෙණයාදිප්‍රත්‍යයෝ; විධෙය්‍යා, කටයුත්තාහුය.

30 සප්පච්චයානං, සප්‍රත්‍යයසහිතවූ; ධාත්වන්තානං, ධාත්වන්තවූ; තවග්ගානං, තවර්ගයන්ට; චවග්ගාව, චවර්ගයද; රචානං, රකාරචකාරයන්ට; යවන්තානංච, යකාරවකාරවද; යථාසාමං, පිළිවෙළනොයික්ම; හොති, වේ.

31 වුච්චතෙ, වුච්චතෙ කියාද; මජ්ජතෙ ච එව, මජ්ජතෙ කියාද; බුජ්ඣතෙ, බුජ්ඣතෙ කියාද; හඤ්ඤතෙ ඉතිච, හඤ්ඤතෙ කියාද; කායයතෙ, කායයතෙ කියාද; දිබ්බතෙ ඉතිච, දිබ්බතෙ කියාද; නිදස්සනං, නිදර්ශනය; සමුද්ධටං, උදුරණ ලද්දේය.

32 ඛජසෙසු; ඛජස යන ප්‍රත්‍යයන්පරකල්හිද; පරොක්ඛායං, පරොක්ෂාවිභක්තියෙහිද, සබ්බධාතුනං, සියලු ධාතුන්ටද; අප්පච්චයෙ, අප්‍රත්‍යයාපරනිමිතින්; ජුහොත්‍යාදිස්ස අපි, ජුහොත්‍යාදිධාතුගණයටද; කිච්චාදිසු, කිච්චප්‍රත්‍යයාදින් පරකල්හි, ක්වචි, කිසිතැනෙක්හිද; ද්වෙභාවො, ද්විත්වවේ.

33 තිතික්ඛති ජිඝච්ඡති විකිච්ඡති ජිගුච්ඡති; තිකිච්ඡති වීමංසති; තිතික්ඛති—පෙ—වීමංසති යනුද; බහුවබහුවු ඉතිච, බහුවබහුවූ යනුද.

---

30 සතප්පච්චයානං—තිපොත්ථකෙ

34 ජුහොති ජුහිතබ්බඤ්ච ජහිතබ්බං ජහිත්වච
ජහිතුං පිදහිත්වාන පහාතබ්බං පහාතවෙ.

35 ඛජසෙසු අවණ්ණස්ස ඉකාරෙ ච ගුපුස්ස ඊ
වස්ස භූස්ස පරොක්ඛායං අකාරෙ න පරස්සිමෙ.

36 තිතික්ඛති ජිඝච්ඡති ජිගුච්ඡති පිවාසති
වීමංසති ච බභූව බභූවුති නිදස්සනං.

37 විධිං නිච්චඤ්ච වාසද්දෙ මානන්තෙසු තු කත්ථචි
දීපෙති නිච්ච මඤ්ඤත්ථ පරොක්ඛාය මසන්තකං.
ගච්ඡමානො ගච්ඡන්තොච ගච්ඡන්තාදිස්ස රූපකං.

---

34 ජුහොති ජුහිතබ්බංච, ජුහොති ජුහිතබ්බං යනුද; ජහිතබ්බං ජහිත්වාච, ජහිතබ්බං ජහිත්වා යනුද; ජහිතුං පිදහිත්වාන පහාතබ්බං පහාතවෙ, ජහිතුං—පෙ—පහාතවෙ යනුද උදාහරණයි.

35 ඛජසෙසු, ඛ ජ ස යන ප්‍රත්‍යයන්පරනිමිත්ත; අවණ්ණස්ස, අවර්ණයහටද; ගුපුස්සච, ගුප යන ධාතුහුගේ උකාරයහටද; ඉකාරෙ, ඉකාරදෙශවේ; වස්ස, වකාරදෙශයාගේ අකාරයහට, ඊං, ඊකාරදෙශවේ; පරොක්ඛායං පරොක්ෂා විභක්තියෙහි, භූස්ස, භූ යන ධාතුහුගේ ඌකාරයහට; අකාරෙ, අකාරදෙශවේ; පරස්ස, අන්‍යයාහට; ඉමෙ, මේ ආදෙශයෝ; න, නොවෙත්.

36 තිතික්ඛති ජිඝච්ඡති ජිගුච්ඡති, තිතික්ඛති ජිඝච්ඡති ජිගුච්ඡති යනුද; පිවාසති, පිවාසති යනුද; වීමංසතිච, වීමංසති යනුද, බභූව බභූවු ඉති, බභූව බභූවු යනුද; නිදස්සනං, නිදර්ශනයි.

37 වාසද්දෙ, (ගමිස්සන්තො යන ආදිසූත්‍රයෙහි) වාශබ්දයෙනම; මානන්තෙසුතු, මාන අන්ත යන ප්‍රත්‍යයන්

---

34 "ජුනොති ජුහිතබ්බඤ්ච ජහිතබ්බං ජහිත්වාන ජහිතුං පිදහිත්වාන"—

35 ඉකාරෙ සගුපුස්සඊ—

36 ජිඝච්ඡති ජිගුච්ඡති පිවාසති වීමංසති බභූවාති නිදස්සනං—

37 "ගච්ඡමානොච ගච්ඡන්තො" ති පොත්ථකෙ.

38 ස්සාමිස්සාමවිභත්තීනං ඛාමි ඛාමා වචා හනා
ඛාමිඛාමෙ වචෙනතාකො හනෙනතා නිග්ගහීතතං
යථා වක්ඛාමි වක්ඛාම පටිහංඛාමි ආදිව —

39 ඛාමිඛාමා වසලහා තෙස මනතස්ස තම්හි චෙ
යථා වච්ඡාමි වච්ඡාම ලච්ඡාමිච්චාදී රූපකං —

---

පරකල්හිවනාහි; කපපාරි, කතිඃයෙහි; නිච්චං විධිංච, නිත්‍යවිධියද; අඤ්ඤත්‍ර, ඉත්පිටහත්තත්හි; අනිච්චං, අනිත්‍යවිධියද; පරොක්ඛායං, පරොක්ෂාවිභක්තියෙහි; අසනතකං, අසත්විධියද; දීපෙති, ප්‍රකාශකෙරේ; ගච්ඡමානො ගච්ඡනතාච, ගච්ඡමානො ගච්ඡනතා යනුද; ගච්ඡති ආදි, ගච්ඡති යන ආදියද; අසස, මෙ‍්‍යහට; රූපකං, රූපකයි —

24 වචා, වච යන ධාතුහුකෙරෙන්ද; හනා, හන යන ධාතුහුකෙරෙන්ද; ස්සාමිස්සාමවිභත්තීනං, ස්සාමිස්සාම විභක්තීන්ට; ඛාමිඛාමා, ඛාමි ඛාම යන ආදෙශයෝ වෙත්; ඛාමිඛාමෙ, ඛාමිඛාම යන ආදෙශයන් පරනිමිතින්; වචෙනතා, වච යන ධාතුහුගේ අනතයතෙම; කො, කකාරාදෙශවේ; හනෙනතා, හන යන ධාතුහුගේ අනතයතෙම; නිග්ගහීතතං, නිග්ගහීතබවට පැමිණේ; යථා, උදාහරණකෙසේද; වක්ඛාමිවක්ඛාම, වක්ඛාමිවක්ඛාම යනුද; පටිහංඛාමි ආදි ච, පටිහංඛාමි යන ආදීයද වේ —

(ආදිශබ්දයෙන් "පටිහංඛාම" යනු ගැණේ)

39 වසලහා; වස ලභ යන ධාතූන්කෙරෙන්; තෙසං, ඒස්සාමිස්සාමවිභක්තීන්ට; ඛාමිඛාමා, ඛාමිඛාම යන ආදෙශයෝ වෙත්; තම්හි, ඒ ආදෙශයා පරනිමිතින්; අන්තස්ස, (ධාතුහුගේ) අන්තයහට; චො, චකාරාදෙශවේ;

---

38 ඛාමිඛාමා වචහනා—හනෙනතාච නිග්ගහීතං—පටිහංඛාමි පටිහංඛාම—

39 තෙසං තම්හි තදනතා කො—ලච්ඡාමි ලච්ඡාම ඉති-හි පොත්ථකෙ.

40 වසලභා භවිස්සන්ති ස්සස්ස ඡො න්තස්ස චො තු ඡේ
යථා වච්ඡති වච්ඡන්ති ලච්ඡන්තාදී නිදස්සනං—

41 හනා ඛො ස්සස්ස නො බින්දු යථා හංඛතිආදිච
පටිහංඛති පටිහං, ඛන්ති ඉච්චෙවමාදිච—

42 වචතො ස්සස්ස ඛො න්තො කො යථා වක්ඛති ආදිච
වක්ඛො වා ස්ස, භවිස්සන්ත්‍යං පවක්ඛිස්සති ආදිච.

---

යථා, හේමෙසේයි; වච්ඡාමි වච්ඡාම, වච්ඡාම් වච්ඡාම යනුද; ලච්ඡාම් ඉති, ලච්ඡාම් යන; ආදි, මේආදියද; රූපකං, උදාහරණයි—

(ආදිග්‍රහණයෙන් 'ලච්ඡාම' යනු ගැණේ)

40 වසලභා, වසලභ යන ධාතූන්කෙරෙන්; භවිස්සන්තිස්සස්ස, භවිස්සන්තිවිභක්තියගේ ස්සකාරයහට; ඡො, ඡකාරාදේශවේ; ඡේ තු, ඡකාරාදේශයා පරකල්හි වනාහි; අන්තස්ස, (ධාතූහුගේ) අන්තයහට, චො, චකාරාදේශවේ; යථා, උදාහරණකෙසේද; වච්ඡති වච්ඡන්ති, වච්ඡති වච්ඡන්ති යනුද; ලච්ඡන්තිආදි, ලච්ඡති යන ආදියද, නිදස්සනං, නිදර්ශනයි—

(ආදිශබ්දයෙන් 'ලච්ඡන්ති' යන ආදිය ගැණේ )

41 හනා, හන යන ධාතූහුකෙරෙන්, ස්සස්ස, ස්සකාරයහට, ඛො, ඛකාරාදේශවේ; නො, (හනධාතූහුගේ) නකාරයතෙම; බින්දු, නිග්‍රහීතාදේශවේ; යථා, හේකෙසේද; හංඛති ආදිච, හංඛති යන ආදියද; පටිහංඛති පටිහංඛන්ති ඉති, පටිහංඛති පටිහංඛන්ති යන; එවමාදිච, මේ ආදියද නිදර්ශනයි—

(ප්‍රථම ආදි ශබ්දයෙන් "හංඛන්ති" යන ආදියද ද්විතීය ආදි ශබ්දයෙන් "පටිහංඛසි" යන ආදියද ගැණේ)

42 වචතො, වච යන ධාතූහුකෙරෙන්; ස්සස්ස, ස්සකාරයහට, ඛො, ඛකාරාදේශවේ; අන්තො, (ධාතූහුගේ) අන්තයතෙම; කො, කකාරාදේශවේ; යථා, හේමෙසේයි;

---

40 ස්සස්සඡො චන්ත මන්තො ඡේ-ලච්ඡාමිලච්ඡාමඉති

41 යථාහංඛති හංඛන්ති-පටිහංඛති හංඛසි
පටිහංඛථ ඉච්චාදි.

42 යථාවක්ඛති වක්ඛන්ති-පවක්ඛිස්සති වක්ඛිස්සන්ති-ති පොත්කෙ.

43 ඉවණ්ණුවණ්ණන්තානඤ්ච ලහූපන්තාන ධාතූනං
ඉවණ්ණුවණ්ණානමෙව වුඩ්ඪි හොති පරස්ස න.
44 යුවණ්ණානම්පි යණ්ණුණා නාණිට්ඨාදීසු වුඩ්ඪි න
තුදාදිස්සාවිකරණෙ න ජෙත්වාදීසු වා සියා.
45 ණුනො විකරණස්ස ච සුණොති සංවුණොතිච
වුච්චතෙ නිරුත්තිච්චාදි නිච්චං උම්හි වරාගමො.

---

වක්ඛති ආදිව, වක්ඛති යන ආදියද වේ; වා, අනික් ක්‍රමයෙක් කියනුලැබේ; භවිස්සන්ත්‍යං, භවිස්සන්ති විභක්තියෙහි; අස්ස, මේ වචධාතුහට; වක්ඛා, වක්ඛ යන ආදේශවේ; පවක්ඛිස්සති, පවක්ඛිස්සති යන, ආදිව, මේ ආදියද නිදර්ශනයි.

43 ඉවණ්ණුවණ්ණන්තානංච, ඉවර්ණඋවර්ණාන්ත ධාතූන්ටද; ලහූපන්තානං ධාතූනං, ලඝූපාන්තධාතූන්ගේ; ඉවණ්ණුවණ්ණානං එව, ඉවර්ණ උවර්ණයන්ටමද; වුඩ්ඪිහොති, වෘද්ධිවේ; පරස්ස, අන්‍යඅකාරයහට; න, වෘද්ධිනොවේ.

44 යණ්ණුණානාණිට්ඨාදිසු, යප්‍රත්‍යය ණුප්‍රත්‍යය ණාප්‍රත්‍යය නාප්‍රත්‍යය නිෂ්ඨාප්‍රත්‍යය යන මේ ආදි ප්‍රත්‍යයන් පරනිමිතින්; යුවණ්ණානං අපි. ඉවර්ණ උවර්ණයන්ටද; වුඩ්ඪින, වෘද්ධිනොවේ; අවිකරණෙ, අවිකරණප්‍රත්‍යයාපරනිමිතින්; තුදාදිස්ස, තුදාදිධාතුහට, න, වෘද්ධිනොවේ; ජෙත්වාදිසු, ජෙත්වා යන ආදියෙහි; වා, විකල්පයෙන්; සියා (වෘද්ධි) වන්නිය.

45 විකරණස්ස, විකරණවූ; ණුනොච, ණුප්‍රත්‍යයහටද (වෘද්ධි) වේ; සුණොති, සුණොති යනුද, සංවුණොතිච; සංවුණොති යනුද උදාහරණයි; උම්හි, උකාරයාපරනිමිතින්, නිච්චං, අවිකල්පයෙන්, වරාගමො, වකාර රකාරාගමවේ; වුච්චතෙ නිරුත්ති ඉති, වුච්චතෙ නිරුත්ති යන, ආදි, මේ ආදිය වේ.

---

45 කිසුණොති සංවුණොති-උම්හිවරාගමො නිච්චං
වුච්චතෙ නිරුත්තිච්චාදී-ති පොත්ථකෙ,

46 සආගමො භූදබ්‍රූතො අජ්ජතනීවිභත්තියං
අරහා භොසි සො භික්ඛු දූතං අදාසි සො නරො.

47 පවිපරිඋදාබ්‍රූතො ආහා සෙ තතො උංසු ච
යථා පබ්‍යාහාසිපබ්‍යා, හංසු පරියුදාහාසි —

48 සඞ්ඛ්‍යායං ගම්‍යමානායං ආඛ්‍යානං නාමිකං සියා
යථා අසඞ්ඛ්‍යසිකො ණ්ඩසඞ්ඛ්‍ය ඉතිහාසො වංකබලි.

---

46 අජ්ජතනීවිභත්තියං, අජ්ජතනීවිභක්තියෙහි; භූදාබ්‍රූතො, භූසත්තායං දාදානෙ බ්‍රූවචනෙ යන ධාතූන් කෙරෙන්; සආගමො, සකාරාගමවේ; අරහා භොසි සො භික්ඛු දූතංඅදාසිසොනරො, අරහා භොසි සො භික්ඛු දූතං අදාසි සොනරො යනු උදාහරණයි —

(සොභික්ඛු, ඒමහණතෙම; අරහා අභොසි, අභිත්වූයේය — සොනරො, ඒමිනිස්තෙම; දූතං අදාසි, දුන්දුන්)

47 සෙ, සකාරනමයාපරනිමිත්තින්; පවිපරිඋදාබ්‍රූතො, පවිය-පරිඋදා යන උපසර්ගයන් පූර්වකොට ඇති බ්‍රූ යන ධාතුනට; ආහා, ආහා යන ආදෙශවේ; තතො, ඒආහා යන ආදෙශයා කෙරෙන් පරවූ; උං, උං විභක්තිය; අංසුව, අංසු යන ආදෙශදවේ; යථා, උදාහරණ මෙසේයි; පබ්‍යාහාසි පබ්‍යාහංසු පරියුදාහාසි, පබ්‍යාහාසි පබ්‍යාහංසු පරියුදාහාසි යනු වේ —

48 සඞ්ඛ්‍යායං, සංඛ්‍යාවක්; ගම්‍යමානායං, හැඟෙනකල්හි; ආඛ්‍යානං, ආඛ්‍යානයෙනම; නාමිකංසියා, නාමය වන්නේය; යථා, හේමෙසේයි, අසඞ්ඛ්‍යසිකොණ්ඩසඞ්ඛ්‍ය, අසඞ්ඛ්‍යසිකොණ්ඩසඞ්ඛ්‍ය යනුද; ඉතිහාසොව, ඉතිහාසො යනුද; මංකබලි, මංකබලි යනුද වේ —

---

47 යථාපරියුදාහාසි — පබ්‍යාහාසි පබ්‍යාහංසු.

48 සඞ්ඛ්‍යාදිච්ඡාය ඛ්‍යානං නාමං, යථා අසඞ්ඛ්‍යසි කොණ්ඩසඞ්ඛ්‍ය, මංකබලි ඉතිහාසාදී-ති
පොත්වෙක.

49 අසඞ්ඛ්‍යා එය්‍යුමෙය්‍යානං ඉයුමියංසුවියාඉයං
සියුං සියංසු තෙ ධම්මා සියා රාජා තථා සියං
සියා කුසලා තථාදීසු සියා පදන්තු අව්‍යයං —

50 එය්‍යාදීහි ජහාසස්ස අස්ස ස්සු අස්ස අස්සථ
අස්ස මස්සාම ආදෙසා සොවමස්සවචනීයො —

51 තෙවමස්සුවචනීයා ත්වං තුම්හෙ අස්ස අස්සථ
තස්ස අස්සං මහෙසී යා මයං අස්සාම රූපකං —

---

49 අසඞ්ඛ්‍යා, අසඞ්ඛ්‍යාතධාතුහුකෙරෙන් පරවූ; එය්‍යුං එය්‍යානං; එය්‍යුංඑය්‍යවිභක්තීන්ට, ඉයුම්යංසු ඉයාඉයං, ඉයුං ඉයංසු ඉයා ඉයං යන ආදෙශයෝ වෙත්, සියුං සියංසු තෙ ධම්මා සියා රාජා තථා සියං, සියුං සියංසු තෙ ධම්මා සියා රාජා තථා සියං යනුවේ; සියා කුසලා ඉති, සියා කුසලා යන; ආදීසු, මේආදියෙහි; සියාපදන්තු, සියා යන පදයතෙම වනාහි; අව්‍යයං, අව්‍යයනම් වේ —

51 එය්‍යාදීහිජහ, එය්‍යාදිශබ්දවිභක්තීන්හා සමග; අසස්ස, අසධාතුහට; අස්ස අස්සු අස්ස අස්සථ අස්සං අස්සාම ආදෙසා, අස්ස අස්සු අස්ස අස්සථ අස්සං අස්සාම යන ආදෙශයෝ වෙත්; සොවමස්සවචනීයො, සොඑවමස්සවචනීයො යනුද —

51 තෙවමස්සු වචනීයා, තෙ එව මස්සු වචනීයා යනුද; ත්වං අස්ස, ත්වං අස්ස යනුද; තුම්හෙ අස්සථ, තුම්හෙ අස්සථ යනුද; තස්ස අස්සං මහෙසී යා, තස්ස අස්සං මහෙසී යා යනුද; මයං අස්සාම, මයං අස්සාම යනුද; රූපකං උදාහරණයි —

(සො, හෙතෙම; එවං වචනීයො අස්ස, මෙසේ කියයුතුවන්නේය— තෙ, ඔව්හු; එවං වචනීයා අස්සු, මෙසේ කියයුතුවන්නාහුය— ත්වං, තෝ; අස්ස, වන්නෙහි

---

50 අසස්සමස්සාමආදෙසො—51 ත්වමස්සතුම්හෙ අස්සථ—තස්ස අස්සං මහෙසියා-මයං අස්සාම ආද යො .හි පොත්ථකෙ.

52 අයස්සා(ආ)ගමස්ස දීඝත්තං මජ්ජතනිය මොස්සි ච
සො ආසි නෙව ආසිංසු ත්වමාසීති නිදස්සනං—

53 දජ්ජෙය්‍යසෙසඤ එය්‍යුමුං, එය්‍යාමිස්සං දජ්ජ දජ්ජා
තෙපි අත්තමනා දජ්ජුං දජ්ජාමං දකරක්ඛිනො.

54 එය්‍යාසිස්සාසිවජ්ජම්හා වුත්තො වජ්ජාසි ච්ඡදනං
එම්හාඅනත්තිස්සකාරෙනො යථාවජ්ජෙනත්තිආදයො.

---

ය—තුම්හෙ, තෙපි; අස්සථ, වන්නහුය—සා, ගම්බදුවූ මම; තස්ස, ඔහට; මහෙසී අස්සං, මෙහෙසී වන්නෙනම්ද-ම යං, අපි; අස්සාම, වන්නෙමු)

52 අජ්ජතනියං, අජ්ජතනිවිභක්තියෙහි; ආගමස්ස, ආගමවූ; අස්ස, අකාරයහට; දීඝත්තං, දීඝීබවද; ඕ ස්ස; ඔවිභක්තිහට; ඉව, ඉකාරාදෙශදවේ; සො ආසි නෙව ආසිංසු ත්වමාසි ඉති, සො ආසි නෙව ආසිංසු ත්වං ආසි යනු; නිදස්සනං, නිදර්ශනයි—

(සො, තෙමෙතම; ආසි, වූයේය—තෙව, ඔව්හුද; ආසිං සු, වූහ—ත්වං, තෝ, ආසි, වූයෙහිය)

53 දජ්ජා, දජ්ජ යන ආදෙශයාකොරෙත්පරවූ; එය්‍ය ස්ස, එය්‍යවිභක්තිහට; එ, එකාරාදෙශද; ආ, ආකාරා දෙශදවේ; එය්‍යුං, එය්‍යුංවිභක්තියට; උං, උං යන ආදෙ ශවේ; එය්‍යාමිස්ස, එය්‍යාමිවිභක්තිහට; අං, අං යන ආ දෙශවේ; දජ්ජෙදජ්ජා තෙපි අත්තමනා දජ්ජුං දජ්ජං අහං දකරක්ඛිනො, දජ්ජෙදජ්ජා තෙපි අත්තමනා දජ් ජුං දජ්ජං අහං දකරක්ඛිනො යනු උදාහරණයි—

(දජ්ජෙ—දජ්ජා, දෙන්නේය—තෙපි, ඔව්හුද; අත්ත මනා, සතුටුසිත්ඇත්තාහු; දජ්ජුං, දෙන්නාහුය—අහං, මම; දකාරක්ඛිනො, දියරකුසියට; දජ්ජං, දෙන්නෙමි)

54 වජ්ජම්හා, වජ්ජ යන ආදෙශයාකොරෙත්පරවූ; එ ය්‍යාසිස්ස, එය්‍යාසිවිභක්තිහට; ආසි, ආසි යන ආදෙශවේ;

---

54 එම්හා අත්තිස්සා(ආ)කාරෙ නො—යථාවජ්ජෙත්ති- වදෙන්ති-පොත්ථක.

55 ධාතෙකාරස්සා යාදයො කෙලායති ගිලායති
මිලායති ඣායතිච හරායතිච ඛායති ──

56 ගම්ස්ස ගම්මා සම්මාව යථා ගම්මති සම්මති
උම්මාසුං දිස ධාතුම්හා අද්දසාසු හාති සද්දපකං ──

57 බින්දුතො ඉංසවාදෙසස්ස ධාතන්තරගති ක්වචි
තෙ තං අසෙස අනාවිසුං යථාභූතං විපස්සිසුං ──

වුත්තො වජ්ජසි වන්දනං, වුත්තො වජ්ජසි වන්දනං යනුවේ; එම්හා, එකාරයාකෙරෙන්පරවූ; අනන්තස්ස, අනන්තවිභක්තියගේ; අකාරෙ, අකාරයතෙම; නො, නොවේ; නොවත් ලොප්වේ, යථා, උදාහරණකෙසේද; වජ්ජන්ති ආදයො, වජ්ජන්ති යන ආදිනු වෙත් ──
(වුත්තො, (තෙමියකුමාරවූ මාවිසින්) කියනලද්දේ; (රථාචාර්‍යාවූ තෝ) වන්දනං, වැඳීම; වජ්ජසි, කියන්නෙහිය-වජ්ජන්ති, කියත්)

55 ආයාදෙ, ති ආදිවිභක්ති පරනිමිත්තින්; ධාතෙකාරස්ස, ධාතුහුගේ එකාරයහට; ආයො, ආය යන ආදේශ වේ; කෙලායති, කෙලායතියනුද; ගිලායති, ගිලායති යනුද; මිලායති, මිලායති, යනුද; ඣායතිච, ඣායති යනුද; හරායතිච, හරායති යනුද, ඛායති, ඛායති යනුද උදාහරණයි ──

56 ගම්ස්ස; ගමු යන ධාතුහට; ගම්මා, ගම්ම යන ආදේශද; සම්මාච, සම්ම යන ආදේශද වේ; යථා, උදාහරණකෙසේද; ගම්මති සම්මති, ගම්මති සම්මති යනුවේ; දිස ධාතුම්හා, දිස යන ධාතුහුකෙරෙන්; උං, උං විභක්තිය; ආසුං, ආසුං යන ආදේශ වේ; අද්දසාසුං ඉති, අද්දසාසුං යනු; සද්දපකා, උදාහරණයි ──

57 ඉංසවාදෙසස්ස, ඉංසු යනආදේශයාගේ; බින්දුතො, බින්දුහුගේ; ක්වචි, කිසිතැනෙක්හි; ධාතන්තරගති, අනය

55 ධාතෙකාරස්සායොතාතාදෙ-මිලායතිච ඣායන්ති-
56 ගම්ස්ස ගම්ම ගච්ඡොචව යථාගම්මති ගච්ඡති-ති
පොත්ථකෙ.

58 ඤාම්හි නිච්චඤ්ච නාලොපො විභාසජ්ජතනාදිසු
අඤ්ඤත්ථ නව හොතෙව නායො තිම්හි යකාරතා.

59 භූවාදිතො ජුහොත්‍යාදි තොච අප්පච්චයො පරෙ
ලොප මාපජ්ජතෙ නාඤ්ඤො වවත්ථිතවිභාසතො.

ස්ථානයකට යාමවේ; තෙ තං අසෙස අයාචිසුං යථාභූතං විපස්සිසුං, තෙ තං අසෙස අයාචිසුං යථාභූතං විපස්සිසුං යනු නිදර්ශනයි—

(තෙ, ඔව්හු; තං, ඔහු; නොහොත්, තා; අසෙස, අසුන්; අයාචිසුං, ඉල්වූහ—යථාභූතං, වූපරිද්දෙන්; විපස්සිසුං දැක්කාහ)

58 ඤාම්හි, ඤාධාතුවිෂයෙහි; නිච්චං, අවිකල්පයෙන්; නාලොපො ච, නාවිකරණයහට ලොප්ද වේ; අජ්ජතනාදිසු, අජ්ජතනීආදියෙහි; විභාසා, විකල්පයෙන් ලොප් වේ; අඤ්ඤත්ථ, සෙසුතන්හි; නවහොති එව, ලොප් නොවේමය; තිම්හි, තිවිභක්ති පරනිමිතින්; නායො, නා යන ආදෙශයාගෙරෙන් (පරවූ නාවිකරණය හට;) යකාරතා, යකාරාදෙශභාව වේ—

(''ඤායති'' යනු ඤා ධාතු විෂයෙහි අවිකල්පයෙන් නාහට ලොපොදාහරණයි—''අඤාසි—අඤ්ඤාසි'' යනු අජ්ජතනියෙහි විකල්පයෙන් නාහට ලොපොදාහරණයි—''නායති'' යනු නා යන ආදෙශයාගෙරෙන් පරවූ නාහට යකාරදෙශොදාහරණයි)

59 වවත්ථිතවිභාසතො, නිශ්චිතවිකල්පය හෙතුකොටගෙණ; භූවාදිතො, භූවාදි ධාතුගණයාගෙරෙන්ද; ජුහොත්‍යාදිතො ච, ජුහොත්‍යාදිධාතුගණයාගෙරෙන්ද; පරෙ; පරවූ; අප්පච්චයො, අප්‍රත්‍යයතෙම, ලොපං, ලොපට; ආපජ්ජතෙ, පැමිණේ; අඤ්ඤො, සෙසු ප්‍රත්‍යයතෙමේ; න, ලොපට නොපැමිණේ—

(''අනුහොති—අනුභවති හනති—හනති'' යනු භූවාදි ධාතු ගණයාගෙරෙන් විකල්පයෙන් අප්‍රත්‍යයට ලො

60 කරස්ස කු කුෘ චෝ ඔස්ස බාලො සීලානි කුබ්බති
සීලවන්තො න කුබ්බන්ති කුෘබ්බතිච්චාදිකං යථා.

61 තරකාරහරාමංසු තේන මග්ගෙන තංසුච
අකංසු සත්ථුවචනං විහංසු විහරංසු වා.

පොදාහරණයි—"ජුහොති—ජහාති" යනු ජුහොත්‍යාදී ධාතු ගණයාකෙරෙන් අප්‍රත්‍යයට ලොපොදාහරණයි)

60 කරස්ස, කරයන ධාතුහට; කු, කුයන ආදෙශද; කුෘ, කුෘ යන ආදෙශද; ඔස්ස, ඔප්‍රත්‍යයහට; චෝ, චකාරාදෙශදවේ; යථා, උදාහරණ කෙසේද; බාලො සීලානි කුබ්බති සීලවන්තො නකුබ්බන්ති, කුෘබ්බති ඉති; බාලො—පෙ—කුෘබ්බති යන; ආදිකං, මේ ආදිය වේ.

("බාලො සීලානි කුබ්බති සීලවන්තො න කුබ්බන්ති" යනු කරධාතුහට කුයනආදෙශහා ඔප්‍රත්‍යයහට චකාරාදෙශොදාහරණයි—බාලො, බාලතෙම; සීලානි, ශීලයන්; කුබ්බති, කෙරේ—සීලවන්තො, සිල්වත්හු, නකුබ්බන්ති, නොකෙරෙත්-"කුෘබ්බති"යනු කරධාතුහට කුෘ යන ආදෙශහා ඔප්‍රත්‍යයහට චකාරාදෙශොදාහරණයි—කුෘබ්බති, කෙරේ—ආදිශබ්දයෙන් "කුෘබ්බන්ති—කුෘබ්බමානො" යන ආදින් ගැණේ)

61 තරකරහරාං, තර. කර. හර යන ධාතූන්කෙරෙන් පරවූ උංවිභක්තියතෙම; අංසු, අංසු යන ආදෙශවේ; තෙන මග්ගෙන අතංසුච, තෙන මග්ගෙන අතංසු යනුද; අකංසු සත්ථුවචනං, අකංසු සත්ථුවචනං යනුද; විහංසු, විහංසු යනුද උදාහරණයි, විහරිංසුවා, විහරිංසුකියාහෝවේ.

60 කරස්සකුකුෘචෝ ඔස්ස-සීලවන්තො නකුබ්බන්ති
බාලො සීලානි කුබ්බති කුෘබ්බති කුෘබ්බමානො—
61 තරකරහරාමංසු, තෙනමග්ගෙන අතංසු-හි
පොත්ථකො.

62 කරධාතුස්ස කො ස්සම්හි ස්සතිම්හි හරස්ස හො.
අහම්පි පූජං කස්සං අප්පමත්තා විහස්සති—

63 ස්සන්තාදීනං ස්සලොපොච යථා දක්ඛිති දක්ඛන්ති
යදා දක්ඛිති මාතඞ්ගං විභජ්ජති විකාසති—

---

(“තෙන මග්ගෙන අතංසු” යනු තරධාතුහට උදාහරණයි-තෙනමග්ගෙන, ඒමාර්ගයෙන්; අතංසු, එතරවූහ-“අකංසු සත්ථුවචනං” යනු කරධාතුහට උදාහරණයි—සත්ථුවචනං, බුදුවචනය; අකංසු, කළාහුය—“විහංසු” යනු හරධාතුහට උදාහරණයි—විහංසු විසූහ)

62 ස්සම්හි, ස්සංවිභක්තිපරනිමිත්තින්; කරධාතුස්ස, කරධාතුහට; කො, කකාරාදේශයවේ; ස්සතිම්හි, ස්සති විභක්ති පරනිමිත්තින්; හරස්ස, හරයනධාතුහට; හො, හකාරාදේශයවේ; අහම්පිපූජංකස්සං අප්පමත්තා විහස්සති, අහම්පි පූජං කස්සං, අප්පමත්තා විහස්සති යනු උදාහරණයි—

(“අහංඅපි පූජංකස්සං” යනු කරධාතුහට උදාහරණයි-අහං අපි, මමද; පූජං, පූජාව; කස්සං, කරන්නෙමි—“අප්පමත්තා විහස්සති” යනු හරධාතුහට උදාහරණයි—අප්පමත්තා, අප්‍රමාදව; විහස්සති, වසන්නේය)

63 ස්සන්තාදීනං, ස්සති ආදි විභක්තීන්ගේ; ස්සලොපොච, ස්සකාරයහට ලොප්ද වේ; යථා, උදාහරණයෙක්ද; දක්ඛිති දක්ඛන්ති යදාදක්ඛිතිමාතඞ්ගං විභජ්ජති විකාසති, දක්ඛිති දක්ඛන්ති යදා දක්ඛිති මාතඞ්ගං විභජ්ජති විකාසති යනුවේ—

(දක්ඛති, දක්නේය; දක්ඛන්ති, දක්නාහුය—යදා, යම් කලෙක්හි; මාතඞ්ගං, මාතඞ්ගයා; දක්ඛති, දක්නේද;-විභජ්ජති, විභාග කරන්නේය—විකාසති, විකාශවන්නේය)

---

62 කරධාතුස්සකොස්සංම්හි අහම්පි පූජංකස්සං
ස්සතිම්හි හරස්ස හො, අප්පමත්තාවිහස්සති—ති
පාඨෙකො.

64 සීදිකාරෙ තු ණෙ ආතතං නිසාදෙතීති ආදිකං
විභත්තීසු සරෙ රස්සො අවොචා ගච්ඡිං නාම යථා
ධාතුස්සරෙව සංයොගෙ රස්සො අච්ඡති ඤූපකං.

65 හීයත්තනජ්ජතනීසු වචස්ස වස්ස අස්ස ඔ
සො අවොච අවොචුං තෙ අහං අවොචාති ආදිකං
උච ත්‍ථමෙහසු වචතො අවොචුත්‍ථ අවොචුම්හා

---

64 ණෙ, ණෙප්‍රත්‍යයා පරනිමිත්තින් සීදිකාරෙතු, සීද යන ධාතුහුගේ ඊකාරයතෙම වනාහි; ආතතං, ආකාර බවට පැමිණේ, නිසාදෙති ඉති, නිසාදෙති යන; ආදිකං, මේ ආදිය උදාහරණයි; විභත්තීසු, විභක්තීන් විෂයෙහි; සරෙ, ස්වරයතෙම; රස්සො, හ්‍රස්වවේ; තං යථා, ශෙහ්නනසේද; අවොච අගච්ඡි, අවොච අගච්ඡි යනුවේ; සංයොගෙ, සංයොගයා පරනිමිත්තින්; ධාතුස්සරෙව, ධාතුහුගේ ස්වරයතෙමේද, රස්සො, හ්‍රස්වවේ; අච්ඡති, අච්ඡති යනු; ඤූපකං, උදාහරණයි

("නිසාදෙතීති ආදිකං" යනමෙහි ආදිග්‍රහණයෙන් නිසාදෙත්වා" යන ආදිය ගැණේ)

65 හීයත්තනජ්ජතනීසු, හීයත්තනී අජ්ජතනී විභක්තින් පරවිෂයෙහි; වචස්ස, වච යන ධාතුහුගේ; වස්ස වකාරයාගේ; අස්ස, අකාරයහට; ඔ, ඔකාරාදෙශවේ සො අවොච තෙ අවොචුං අහං අවොචං ඉති, සො අවොච තෙ අවොචුං අහං අවොචං යන, ආදිකං, මේ ආදිය උදාහරණයි; ත්‍ථමෙහසු, ත්‍ථ විභක්ති ම්හා විභක්තීන්පරනිමිත්තින්; වචතො, වච යන ධාතුහුකෙරෙන්; උච, උකාරාගමදවේ; අවොචුත්‍ථ අවොචුම්හා, අවොචුත්‍ථ අවොචුම්හා යනු උදාහරණයි

---

64 "සීදස්සීකාරෙ ණෙ ආතතං නිසාදෙති නිදෙත්වා යථා අවොච අගච්ඡි, රස්සො භවති අච්ඡති"

65 "වචස්ස වස්සාකාරෙඔ හීයත්තනජ්ජතනීසු-සො අවොචඅවොචුං තෙ අහං අවොචම්ච්චාදි,වචතො ත්‍ථමෙහසුව, අවොචුත්‍ථ අවොචුම්හා —ගිපොඨෙහ,

66 රුදන්තාස්ස භවිස්සන්‍යං චකාරෙ ස්සස්ස ච්චො යථා
රුච්චතිරුච්චන්ත්‍යාදි රොදිස්සතීති ආදි වා—

67 ආතොනීතො කුසාදීනං ඊච්ඡං රස්සාච හොන්තිතෙ
අක්කොසති අක්කොසන්ති නියච්ඡති නියච්ඡන්ති ච.

68 අජ්ජතන්‍යත්තු පාවෙක්ඛි පාවෙක්ඛා පවිසස්ස ච
හීයත්තන්‍යං උවාදෙසො හූස්ස ඌස්ස සියාහුවා—

---

66 භවිස්සන්‍යං, භවිස්සන්ති විභක්තියෙහි; රුදන්තස්ස, රුදයන ධාතුහුගේ අන්තාගමට; චකාරෙ, චකාරාදෙශ වේ; ස්සස්ස, ස්සකාරයහට; ච්චො, චකාරාදෙශ වේ; යථා, උදාහරණකෙසේද; රුච්චතිරුච්චන්ති ඉති, ආදි, රුච්චති රුච්චන්ති යන ආදිය වේ; රොදිස්සති ඉති, රොදිස්සති යන, ආදිවා, මේ ආදියහෝ වේ—

67 ආතො, ආ යන උපසර්ගයාකෙරෙන්ද; නීතො, නී යන උපසර්ගයාකෙරෙන්ද; කුසාදීනං, කුසාදිධාතුන්ට; ඊච්ඡං, ඊච්ඡවේ; තෙ, ඒ ආ නී යන උපසර්ගයෝ; රස්සා ච හොන්ති, හ්‍රස්වද වෙත්; අක්කොසති අක්කොසන්ති, අක්කොසති අක්කොසන්ති යනුද; නියච්ඡති නියච්ඡන්ති ච, නියච්ඡති නියච්ඡන්ති යනුද උදාහරණයි—

68 අජ්ජතන්‍යංතු, අජ්ජතනියෙහි වනාහි; පවිසස්සච, පවිශ් විස යන ධාතුහටද; පාවෙක්ඛා, පාවෙක්ඛ යන ආදෙශවේ; පාවෙක්ඛි, පාවෙක්ඛි යනුවේ; හීයත්තන්‍යං, හීයත්තනීයෙහි; හූස්ස, හූ යනධාතුහුගේ; ඌස්ස, ඌකාරයහට; උවාදෙසො, උවා යන ආදෙශයතෙම; සියා, වන්නේය; අහුවා, අහුවා යනු වේ—

---

66 රුදතො ච්චො භවිස්සන්‍යං, ස්සස්සචොචිර ග
ණනායාය, රුච්චති චෙව රුච්චන්ති. රුච්චිවා රොදිස්සති.
67 නියච්ඡති නියච්ඡතීතිච—
68 පවිසස්සච පාවෙක්ඛා අජ්ජතන්‍යත්තු පාවෙක්ඛි
හුස්සූකාරෙ හීයත්තන්‍යං උවාදෙසොච අහුවා-ති
ඉපාදුල්කෙ.

69 හූතො ජ්ජතනි ඊ ලොපො අහු රජාති රූපකං
හූතො පරස්ස ජ්ජතනි ඔ:සිම්මුං අහොසි ත්වං
අහං කෙවට්ටගාමස්මිං අහුං කෙවට්ටදාරකො.

70 සණ්ඨාතො හාගමො තම්හි රස්සො සණ්ඨහති ක්වචි
පතිට්ඨාතො තථෙවවා යථා පතිට්ඨහිස්සති ——

71 වධො හතස්ස සබ්බත්‍ථ වධති ච්චෙවමාදිකං
ධාස්ස හො බ්‍යාස විසයෙ විදහාතීති ආදි ච ——

---

69 හූතො, හූ යන ධාතුහුකෙරෙන්; අජ්ජතනිඊලොපො, අජ්ජතනි ඊවිභක්තිහට ලොප්වේ; අහුරාජා ඉති, අහුරජා යනු; රූපකං, රූපකයි; හූතො, හූ යන ධාතුහුකෙරෙන්, පරස්ස, පරවූ; අජ්ජතනි ඔස්ස, අජ්ජතනි ඔවිභක්තිහට; ඉව, ඉකාරාදෙශදවේ, ඉං, ඉංවිභක්තිය; උං, උං යන ආදෙශවේ; ත්වං අහොසි. ත්වං අහොසි යනුද; අහං කෙවට්ටගාමස්මිං අහුං කෙවට්ටදාරකො, අහං කෙවට්ටගාමස්මිං අහුං කෙවට්ටදාරකො යනුද උදාහරණයි ——

(ත්වං, තෝ; අහොසි, වූයෙහිය — අහං, මම, කෙවට්ටගාමස්මිං, කෙවුල් ගමෙහි; කෙවට්ටදාරකො අහුං, කෙවුල්දරුවෙක් වීමි)

70 සංඨාතො, සංපූර්වවූ ඨා යන ධාතුහුකෙරෙන්, හාගමො; හකාරාගමවේ; තම්හි, ඒහකාරාගමයා පරතිම්හින්; ක්වචි, කිසිතැනෙක්හි; රස්සො, හ්‍රස්වවේ, සණ්ඨහති, සණ්ඨහති යනුවේ; පතිට්ඨාතො, පතිපූර්වවූ ඨා යන ධාතුහුකෙරෙන්; වා, විකල්පයෙන්; තථාඑව, එසේම හකාරාගම හා හ්‍රස්වවේ, යථා, කෙසේද, පතිට්ඨහිස්සති, පතිට්ඨහිස්සති යනුවේ ——

71 සබ්බත්‍ථ, හැමතැන්හි; හතස්ස, හන යන ධාතුහට; වධො, වධ යන ආදෙශවේ; වධති ඉති, වධතියනත;

---

69 අජ්ජතනී ඊලොපොව හූතො යථා අහුරජා, හූතො පරා අජ්ජතන්‍යං, ඔස්සිම්මුං ත්වමහොසීති —
70 රස්සො ක්වචි සණ්ඨහති —
71 වධති වධන්තිච්චාදි — විදහාතිදහන්තිච්චා — තී පොත්හෙක.

72 භුජතො සස්ස ඛො නම්හි ජස්සවා කොපි හොක්ඛති
හොක්ඛන්ති හොක්ඛිස්සතිවා ඉච්චාදිතු නිදස්සනං
73 එකෙ න සංයොගන්තත්තා වුද්ධි හොතීති අබ්‍රවුං
බින්දුවාගමා තථාපෙ'කෙ මුඤ්චතාදිසු වුද්ධින—
74 යම්හි ආදුස්සතො නා ඉත්තං සමාදියති ආදිසු
යම්හි ආනත්තං ජනතො නො යථා ජායති ආදිකං.

එව්මාදිකං, මේආදිය උදාහරණයි; අබ්භාස විසයෙහි, අබ්භාසසංඥෙවිෂයෙහි; ධාස්ස, ධා යනධාතුහට; හො, හකාරාදෙශයවේ; විදහති ඉති, විදහති යන; ආදිච, මේආදි යද උදාහරණයි—

(මෙහි ප්‍රථම ආදිශබ්දයෙන් "වධන්ති" යන ආදින්ද දෙවන ආදිශබ්දයෙන් "විදහන්ති" යන ආදින්ද ගැණේ)

72 භුජතො, භුජ යන ධාතුහුමෙකෙරෙන්; සස්ස, සකාරයහට, ඛො, ඛකාරාදෙශද; නම්හි, ඒ ඛකාරාදෙශයා පරනිමිත්තින්; ජස්ස, (ධාත්වන්ත) ජකාරයහට; කො අපි, කකාරාදෙශද, වා, විකල්පයෙන්වේ; හොක්ඛති හොක්ඛන්ති, හොක්ඛති හොක්ඛන්ති යනුවේ; හොක්ඛිස්සතිවා, හොක්ඛිස්සති කියාහෝවේ; ඉච්චාදිතු, මේ ආදියතෙමේ වනාහි; නිදස්සනං, නිදර්ශනයි—

73 මුඤ්චතිආදිසු, මුඤ්චති යන ආදියෙහි; එකෙ, සමහරු; සංයොගන්තත්තා, සංයොගාන්තබැවින්; වුද්ධි, වෘද්ධි තොමෝ; නහොති ඉති, නොවේයයි; අබ්‍රවුං, කියත්; එකෙ, සමහරු; බින්දුවාගමා, නිග්ගහීතාගමවනහෙයින්; තථාපි, එසේම: වුද්ධි, වෘද්ධිය; න, නොවේ; (යයි කියත්)

74 යම්හි, යප්‍රත්‍යයා පරනිමිත්තින්; ආදුස්ස, ආදූෂිද යන ධාතුහුගේ; අතො, අන්ත්‍යතෙම; ඉත්තං, ඉකාර

72 ජස්ස කොවාපි හොක්ඛති හොක්ඛන්තිවා හොක්ඛස්සති—
73 එකෙ අසංයොගන්තත්තා වුද්ධිහොතිපකාසියාති.
74 යථා ජායති ජායන්ති—ති පොත්ථකෙ.

75 කාගමෙන සකස්ස නෙනා ඛකාරෙ ජ්ජතනාදිසු
යථා සක්ඛි අසක්ඛිංසු සක්ඛිස්සන්ති ආදි ච—

76 නාම්හි කීස්සච රස්සත්තං කිණාති තස්සණෙ සියා
යථාරහං සාගමොතු විභාසා හොති ධාතුතො
අජෙසි යෙසො අකාසි ඉච්චෙවමාදි වා අකා—

රබවටයේ; සමාදියති ආදියි, සමාදියති ආදියි යනුවේ; යම්හි, යප්‍රත්‍යයාපරනිමිතින්; ජනෙනා, ජන යන ධාතුහුගේ අනතවූ; නො, නකාරයතෙම; ආත්තං, ආකාරබවට පැමිණේ; යථා, උදාහරණකෙසේද; ජායති ආදිකං, ජායති යන ආදිය වේ—

(ආදිශබ්දයෙන් 'ජායන්ති' යන ආදිය ගැණේ)

75 අජ්ජතනාදිසු, අජ්ජතනීවිභක්තිආදීයෙහි; සකස්ස, සක යන ධාතුහුගේ; අන්තො, අන්තයතෙම; කාගමෙන; කකාරාගමයහාසමග; ඛකාරෙ, ඛකාරදේශ වේ; යථා, කෙසේද, අසක්ඛි අසක්ඛිංසු, අසක්ඛි අසක්ඛිංසු යනුද; සක්ඛිස්සති ඉති, සක්ඛිස්සති යන; ආදි ච, මේ ආදියද වේ—

(පළමු ආදිශබ්දයෙන් භවිස්සන්ති කාලාතිපත්ති විභක්ත්‍යාදිය ගැණේ—දෙවන ආදිශබ්දයෙන් "සක්ඛිස්සන්ති" යන ආදියද "අසක්ඛිස්සා" යන ආදියද ගැණේ)

76 නාම්හි, නාවිකරණයා පරනිමිතින්; කීස්ස, කීයන ධාතුහට; රස්සත්තංච, හ්‍රස්වබවද; නස්ස, දන්ත්‍යනකාරයහට, ණො, මූර්ධන්‍ය ණකාරයද; සියා, වන්නේය; කිණාති, කිණාති යනු වේ; ධාතුතො, ධාතුහුකෙරෙන්;

75 කාගමෙන සකන්තොඛො අජ්ජතනාදිසුචසක්ඛි
අසක්ඛිංසු සක්ඛිස්සති සක්ඛිස්සන්ති අසක්ඛිස්සා.

76 නාම්හි කීස්සච රස්සත්තං, ණදෙසො නස්සකිණාති
යථාරහං සාගමොවා ධාතුතො අජෙසි යෙසො
අකාසිච්චාදි වා අකා—ති පොත්ථකෙ.

77 යෙ වා කම්ම කරොන්තායො කය්‍යතෙ වං කරීයති
සූයෙන්තානං යම්හිකම්මවාධම්මොපොසෙනසූය්‍යති·

78 එයනාමස්සෙමු කණ්චි විහරෙමු තයා ගුත්තා
න නො දක්ඛමු සම්බුද්ධං කථං ජානෙමු තං මයං
තස්ස ඔමු තතාදිම්හා පපොතාමු අමතං මයං.

---

යථාරහං, සුලුසුපරිද්දෙන්; සාගමො ත, සාකාරාගමය ව නාහි; විභාසා, විකල්පයෙන්; හොති, වේ; අජෙසිය ඛොබා අකාසි අති, අජෙසි යක්ඛා අකාසි යනු; ආදි, මේආදියවේ; අකාවා, අකා කියාහෝවේ.

77 කම්ම, කර්‍මසාධනයෙහි; යෙ, යප්‍රත්‍යයාපරනිමිතින්; කරොන්තා, කරයනධාතුහුගේ අන්තයතෙම; වා, විකල්පයෙන්; යො, යකාරාදෙශවේ; කය්‍යතෙ, කය්‍යතෙ යනුවේ; කරීයතිවා, කරීයතිකියාහෝ වේ; කම්ම, කර්‍මසාධනයෙහි; යම්හි, යප්‍රත්‍යයා පරනිමිතින්; සූයෙන්තා, සූයනධාතුහුගේ අන්තයතෙම; වා, විකල් පයෙන්; එන්තං, එකාරබවට පැමිණේ; ධම්මො පොසෙන සූය්‍යති, ධම්මො පොසෙන සූයයති යනුඋදාහරණයි.

(පොසෙන, පුරුෂයාවිසින්; ධම්මො, ධර්‍මයතෙම, සූයයති, දත්තාලැබේ)

78 එයනාමස්ස, එනාමවිභක්තිනට; කණ්චි, කිසිතැනෙක්හි; එමු, එමු යන ආදෙශවේ; විහරෙමු තයා ගුත්තා න නො දක්ඛමු සම්බුද්ධං කථං ජානෙමු තං මයං, විහරෙමු තයා ගුත්තා න නො දක්ඛමු සම්බුද්ධං කථං ජානෙමු තං මයං යනු වේ; තතාදිම්හා, තතාදිධාතුගණයාකෙ

---

77 යම්හි කම්මකරොන්තායො කය්‍යතෙකරීයතිවාති—

78 කථං ජානෙමු තං මයං, න නො දක්ඛමු සම්බුද්ධංති—පොත්ථකෙ.

79 යපුබ්බා ඉආගමම්හා ඤාධාතුයස්ස ස්සස්ස ඤි
තංයථා පඤ්ඤාසිඤිති පඤ්ඤාසිඤිත්ති ඇදිච—

80 නිච්චං නාම්හි ඉ මාතනෙනා යථා මිනාති ආදිච
නාම්හි අනෙනාතු ධාතුස්ස රස්සො නිච්චං සියා යථා
ලුනාති පුනාති ධුනාති, මුනාති ඉති ආදිච—

---

ෙරන්; තස්ස, ඒඑනනම විභක්තිනට; ඔමු, ඔමු යන ආදෙශවේ; පපොමු අමතං මයං; පපොමු අමතං මයං යනුවේ (තයා, තාවිසින්; ගුත්තා, රක්තාලද්දාහු; විහරෙමු, වසන්නෙමු—තෙ, අපි; සම්බුධං, බුදුරජහු; නදෙක්ඛමු, නොදකින්නෙමු—මයං, අපි; තං, එය; තථං, තෙසේ; ජානෙමු, දන්නෙමුද;—මයං, අපි; අමතං, නිර්වාණයට; පපොමු, පැමිණෙන්නෙමු)

79 ඤාධාතුයංච, ඤාධාතුවෙහිද; යපුබ්බා, යකාරපූර්වවූ; ඉආගමම්හා, ඉකාරාගමයාකෙරෙන්; ස්සස්ස, ස්සකාරයහට; ඤි, ඤි යන ආදෙශවේ; තංයථා, හේකෙසේද; පඤ්ඤාසිඤ්ති පඤ්ඤාසිඤින්ති, පඤ්ඤාසිඤිති පඤ්ඤාසිඤින්ති යන; ආදිච, මේ ආදීහුද වේ—

80 නාම්හි, නාප්‍රත්‍යයපරනිමිත්තින්; මාතනෙනා, මා යන ධාතුහුගේ අනන්‍යතෙම; නිච්චං, අවිකල්පයෙන්; ඉ, ඉකාරාදෙශවේ; යථා, උදාහරණකෙසේද; මිනාතිආදිච; මිනාති යන ආදීහුද වේ; නාම්හි, නාප්‍රත්‍යය පරනිමිත්තින්, ධාතුස්ස, ධාතුහුගේ; අනෙනාතු, අනන්‍ය තෙමවනාහි; නිච්චං, අවිකල්පයෙන්; රස්සො සියා, හ්‍රස්වවන්නේය; යථා, උදාහරණකෙසේද; ලුනාති පුනාති ධුනාති මුනාති ඉති, ලුනාති පුනාති ධුනාති මූනාති යන; ආදිච, මේ ආදීහුද වේ—

---

80 යථාමිනාති මිනනති, නාම්හි රස්සො ධාතුස්ස
අනෙනා, නිච්චං ලුනාති පුනාති, ධුනාති මුනාති
ඉච්චා—ති පොත්කෙ-

81 ඉස්සාගමස්ස එත්තඤ්ච අග්ගහෙසි අග්ගහෙසුං
කස්සන්තුත්තං කරෙහිස්ස කුරුතෙව යථාරහං.

82 කරන්තො තොඋම්හිඋතො උස්ස බත්තඤ්ච කුබ්බති
කරෙහිස්ස සිරෙ රෙ නො කයිරතීති ආදිව.

83 මනන්තරම්හි කම්මනි යරානං විපරියයො
කයිරති කයිරන්ති කයිරතෙති ආදිකං.

---

("ලූ ඡෙදනෙ පූ පවනෙ ධූ කම්පනෙ මූ බන්ධනෙ" යන ධාතූන් ප්‍රකෘති උකාරාන්ත බැවින් මේ හ්‍රස්වය අප විසින් නොකැමැතිවනලදි)

81 ආගමස්ස, ආගමවූ; ඉස්ස, ඉකාරයහට; එත්තංච එකාරදෙශ බවද වේ; අග්ගහෙසි අග්ගහෙසුං, අග්ගහෙසි අග්ගහෙසුං යනුවේ; කරෙහිස්ස, කරයනධාතුහුගේ; කස්ස, කකාරයාගේ; අන්තො, අන්තයතෙම; යථාරහං, සුදුසුපරිද්දෙන්; උත්තං, උකාරබැව පැමිණේ; කුරුතෙව, කුරුතෙයනුද උදාහරණයි.

82 උම්හි, උකාරදෙශයාපරනිමිත්තින්; කරන්තො, කරයනධාතූනගේ අන්තායතෙම; නො, නොවේ; හෙවත්, ලොප්වේ; උතො, උකාරයාකෙරෙන් පරවූ; උස්ස, උකාරයහට; බත්තංච, බකාරදෙශබවද වේ; කුබ්බති, කුබ්බතියනුවේ; සිරෙ, සිරප්‍රත්‍යයා පරනිමිත්තින්; කරෙතිස්ස, කරයන ධාතුහුගේ; රෙ, රකාරයතෙම; නො, නොවේ; හෙවත්, ලොප්වේ; කයිරති ඉති, කයිරතියන; ආදිව, මේ ආදියද වේ.
(ආදිශබ්දයෙන් "කයිරන්ති" යන ආදිත් ගැණේ)

83 මනන්තරම්හි, මනහෙදයක්හි; කම්මනි, කර්මයෙහි; යරානං, යකාර රකාරයන්ගේ; විපරියයො, විපර්‍යාසයවේ; කයිරති කයිරන්ති කයිරතෙ ඉති, කයිරති කයිරන්ති කයිරතෙ යන; ආදිකං, මේ ආදියවේ.

---

81 යථාරහඤ්ච කුරුතෙති —
82 "කරීයති කරීයන්ති" — තිපොත්වෙහි.

84 එය්‍යස්සා එථස්සාථ එය්‍යුමුං එය්‍යාසිස්සාසි
එය්‍යාථා එය්‍යාමිස්සාමි එය්‍යාමස්සාමබො සිරා—

85 සබ්බයෙය්‍යාසෙය්‍යාමිනෙ සො ත්වං අහං කරෙචරෙ
දදෙ භුඤ්ජෙ මනෙ ගවෙජ වහෙ වදෙ භවෙ ඉති—

86 කරස්සන්තස්ස රස්සත්තං හීයත්තනී විභත්තියං
සුදුක්කාරං අකා ලොකෙ සබ්බාරිවිජයං අකා—

84 සිරා, සිරප්‍රත්‍යයාකෙරෙන්; එය්‍යස්ස, එය්‍ය විභක්තිහට; ආ, ආකාරාදෙශද; එථස්ස, එථවිභක්තිහට; ආථ, ආථයන ආදෙශද; එය්‍යුං, එය්‍යුංවිභක්තිහට, උං, උං යන ආදෙශද; එය්‍යාසිස්ස, එය්‍යාසිවිභක්තිහට; ආසි, ආසි යන ආදෙශද; එය්‍යාථ, එය්‍යාථවිභක්තිහට; ආථ, ආථයන ආදෙශද; එය්‍යාමිස්ස, එය්‍යාමි විභක්තිහට; ආමි, ආමි යන ආදෙශද; එය්‍යාමස්ස, එය්‍යාමවිභක්තිහට; ආමබො, ආම යන ආදෙශද වේ—

85 සබ්බ, සියලුධාතූන්කෙරෙන්; එය්‍ය එය්‍යාසි එය්‍යාමිනං, එය්‍ය එය්‍යාසි එය්‍යාමි යන විභක්තීන්ට, එ, එකාරාදෙශවේ; සො ත්වං අහං කරෙ චරෙ දදෙ භුඤ්ජෙ මනෙ ගවෙජ වහෙ වදෙ භවෙ ඉති, සො ත්වං අහං කරෙ—පෙ—භවෙ යනු උදාහරණයි—

89 හීයත්තනී විභත්තියං, හීයත්තනී විභක්තියෙහි; කරස්ස, කර යන ධාතුහුගේ; අන්තස්ස, අන්තාවූ; රස්ස, රකාරයහට; අත්තං, අත්වවේ; සුදුක්කාරං අකා ලොකෙ සබ්බාරි විජයං අකා, සුදුක්කාරං අකා ලොකෙ සබ්බාරිවිජයං අකා යනුවේ—

(ලොකෙ, ලොකයෙහි; සුදුක්කාරං, ඉතා දුෂ්කරයක්; අකා, කෙළේය; සබ්බාරි විජයං අකා, සියලු සතුරන්ගේ ජයගැන්ම කෙළේය)

84 “එය්‍යාමස්සාම සිරතො”—
86 හීයත්තනීයං කරස්සත්තං අකාලොකෙ සුදුක්කාරං
සබ්බාරිවිජයංඅකා—ති පොත්වල.

87 ඛරෙ අභිසඞ්ඛරස්සා භිසඞ්ඛරොති ත්‍යාදිසු
ක්වචිඅඤ්ඡොගමිස්සන්තො අජ්ජතන්‍යංඅගඤ්ඡිසො

88 ක්වචි තම්හි සියා කාර ගමො ච ගම්ධාතුතො
සාගමොච අගමාසි උමංසු අගමංසුච
තුම්හෙගමුත්ථ ගමුම්හා වත්ථම්හෙසු උආගමො

89 ගමිස්ස ගො යථාතන්ති තණ්හානං ඛයමජ්ඣගා
කම්බලස්සතරා ආගුං සොපාග සමිතිං වනං

---

87 ත්‍යාදිසු, තිආදිවිභක්තීන් පරනිමිතින්; අභිසඞ්ඛරස්ස, අභිසංපූර්ව කර යන ධාතුහට; ඛරෙ, ඛර යන ආදෙශවේ; අභිසඞ්ඛරොති, අභිසඞ්ඛරොති යනුවේ; අජ්ජතන්‍යං, අජ්ජතනී විභක්තියෙහි; ගමිස්ස, ගමු යන ධාතුහුගේ; අන්තො, අන්තයතෙම; ක්වචි, කිසිතැනෙක්හි; අඤ්ඡො, අඤ්ඡ යන ආදෙශවේ; සොඅගඤ්ඡි, සො අගඤ්ඡි යනු උදාහරණයි.

88 තම්හි, ඒ අජ්ජතනීවිභක්තියෙහි; ගම්ධාතුතො, ගමු යන ධාතුහුකෙරෙන්; ක්වචි, කිසිතැනෙක්හි; ආකාරගමොච, ආකාරගමද; සාගමොච, සකාරාගමද; සියා, වන්නේය; අගමාසි, අගමාසි යනුවේ, උං, උංවිභක්තිය, අංසුච, අංසු යන ආදෙශද වේ; අගමංසු, අගමංසු යනුවේ; ත්ථම්හෙසු, ත්ථ ම්හ යන විභක්තීන් පරනිමිතින්; උආගමො, උකාරාගමවේ; තුම්හෙගමුත්ථ, තුම්හෙගමුත්ථ යනුද; ගමුම්හාච, ගමුම්හා යනුද උදාහරණයි.

89 ගමිස්ස, ගමු යන ධාතුහට; යථාතන්ති, පෙළවූ පරිද්දෙන්; ගො, ගකාරාදෙශවේ; තණ්හානං ඛය මජ්ඣගා කම්බලස්සතරා ආගුං සොපාග සමිතිං වනං, තණ්හානං ඛය මජ්ඣගා කම්බලස්සතරා ආගුං සොපාග සමිතිං වනං යනු උදාහරණයි.

---

87 අභිසඞ්ඛරස්සඛරෙ ත්‍යාදිස්වාභිසඞ්ඛරොති අජ්ජතන්‍යං සො අගඤ්ඡි—
88 ගම්මිහා ක්වචි ආ තම්හි සාගමොච අගමාසි, උමංසුච අගමංසු, උආගමොවත්ථම්හෙසු, තුම්හෙගමුත්ථ ගමුම්හා—ති පොත්ථකෙ.

90 භවිස්සන්ත්‍යං ඝිදස්සවා ධෙච්ඡාස්සෙනවධෙච්ඡති
ධෙච්ඡන්ති ධෙච්ඡසිච්චාදි විඤ්ඤාතබ්බං නිදස්සනං
ඝිදස්ස සෙසන හෙච්ඡාච අවිජ්ජං හෙච්ඡතීතිච—

91 ඝිදඝිදුතජ්ජනත්‍යං ධෙච්ඡ හෙච්ඡා යථාක්කමං
අධෙච්ඡිඡුං වන හොරුක්ඛං අධෙච්ඡිච අහෙච්ඡිච.

92 පුරිස විපල්ලාසො වා පුත්‍යතං ලභෙථ වරදං
යථා ලාවෙති තාලෙති ලුනීතො කාරිතෙසු ණෙ.

---

90 භවිස්සන්ත්‍යං, භවිස්සන්තිවිභක්තියෙහි; ස්සෙන ච, ස්සකාරයහාසමගද; ඝිදස්ස, ඝිද යන ධාතුහට; වා, විකල්පයෙන්, ධෙච්ඡා, ධෙච්ඡ යන ආදෙශයවේ; ධෙච්ඡති ධෙච්ඡන්ති ධෙච්ඡසි ඉති, ධෙච්ඡති ධෙච්ඡන්ති ධෙච්ඡසි යනු; ආදි, මේආදිවූ; නිදස්සනං, නිදර්ශනය; විඤ්ඤාතබ්බං, දතයුත්තෝය; ස්සෙන, ස්සකාරයහාසමග; ඝිදස්ස, ඝිද යන ධතුහට; හෙච්ඡාච, හෙච්ඡා න ආදෙශයදවේ; අවිජ්ජං හෙච්ඡති ඉති ච, අවිජ්ජංහෙච්ඡති යනුද උදාහරණයි—

91 අජ්ජතන්‍යං, අජ්ජතනී විභක්තියෙහි; ඝිදඝිදුතං, ඝිදඝිද යන ධාතුන්ට; යථාක්කමං, පිළිවෙළින්; ධෙච්ඡ හෙච්ඡා, ධෙච්ඡ හෙච්ඡ යන ආදෙශයෝ වෙත්; අධෙච්ඡිඡි අධෙච්ඡිඡුං වන හොරුක්ඛංච, අධෙච්ඡිඡි අධෙච්ඡිඡුං වන හො රුක්ඛං යනුද, අහෙච්ඡිච, අහෙච්ඡි යනුද උදාහරණයි—

92 වා, විකල්පයෙන්; පුරිසවිපල්ලාසො, පුරුෂවිපර්‍යාසය යයවේ; පුත්‍යතං ලභෙථ වරදං; පුත්‍යතං ලභෙථ වරදං ය

---

90 ධෙච්ඡන්ති ධෙච්ඡසිච්චාදි, ඝිදස්ස සෙසන හෙච්ඡාචාති—

91 ''අධෙච්ඡිඡි කට්ඨමහෙච්ඡීති—

92 ලුනීතො කාරිතෙසුණෙ යථාලාවෙතිතාලෙතී-ති පොත්ථකෙ.

93 පරව සාතො ණෙණපෙ වෙකක්ඛණම්හි කාරිතා
යථා පරියොසාපෙති කුටිං විප්පකතත්තනා—

94 සෙගමාඛ්‍යාතතාමෙහි කථං අම්හෙ කරෙම සෙ
එවං ඛ්‍යාතම්හි නාමෙතු බුද්ධං සරණං ගතා සෙ—

95 අකාරම්හ ස තෙ කිච්චං ඉච්චාදිසු අකාරතා
ඔසානත්තාමසි භූතානි ඉච්චාදිසු ඉකාරතා—

---

නුවේ; ලුනීතො, ලූන නීය යන ධාතුන්කෙරෙන්; කාරිතෙසු, කාරිතයන්අතුරෙන්; ණෙ, ණෙප්‍රත්‍යයවේ; යථා, මේමෙසේයි; ලාවෙති නායෙති, ලාවෙහි නායෙති, යනුවේ—

93 සාතො, සායනධාතුහුකෙරෙන්; පර, එව, පරව ම; වෙණෙණපෙකාරිතා, ණෙණපෙ යන කාරිත ප්‍රත්‍යයෝ දෙදෙන, එකක්ඛණම්හි, එකක්ෂණයෙහි වෙත්; යථා, උදාහරණකෙසේද; පරියොසාපෙති කුටිං විප්පකතත්තනා, පරියොසාපෙති කුටිං විප්පකතත්තනා යනුවේ—

(විප්පකතං, අඩාලකරනලද; කුටිං, කිළිය; අත්තනා, තෙමේ; පරියොසාපෙති, අවසන්කරවයි)

94 ආඛ්‍යාතතාමෙහි, ආඛ්‍යාතනාමයන්කෙරෙන්; සෙ ආගමො, සෙ යන ආගමයවේ; ආඛ්‍යාතම්හි, ආඛ්‍යාතයෙහි; කථං අම්හෙකරෙමසෙ, කථං අම්හෙ කරෙමසෙ යනුවේ, එවං, එසේම; නාමෙතු, නාමයෙහි වනාහි; බුද්ධං සරණං ගතා සෙ, බුද්ධං සරණං ගතාසෙයනුවේ.

95 අකාරම්හසතෙකිච්චං ඉති, අකාරම්හසතෙකිච්චං යන, ආදිසු, මේ ආදියෙහි, අකාරතා, අකාරබවවේ; ඔසානත්තාමසිභූතානි ඉති, ඔසානත්තාමසිභූතානි යන, ආදිසු, මේ ආදියෙන්; ඉකාරතා, ඉකාරදේශ බවවේ.

---

93 පරවෙසොතො—ති පොත්ථකෙ—

96 පජ්ජෙ හීනම්හි වත්තබ්බෙ ඉම්ස්සං හොති තං යථා
අහං පුරෙ සඤ්ඤමිස්සං සඤ්ඤාවිස්සං අනිබ්බිසං
උපොසථං උපවසිස්සං නිරයම්හි අපච්චිස්සං——

97 අජ්ජතන්‍යම්මාත්තං වා තණ්හානං බ්‍ය මජ්ඣගා
අධිගච්ඡිත්ථ හෙත්ථෙත්ථ අජ්ඣගත්ති ච වා පන

98 නාම්හි රස්සො කියාදීනං සංයොගෙ ච ඤඤ ධාතුනං
ආඛ්‍යාතං වා විභත්තීනං ම්හාස්ස ත්‍යනුස්ස ච රස්සතා.

---

96 පජ්ජෙ, පද්‍යයෙහි; හීනම්හි, අතීතකාලය, වත්තබ්බෙ, කිවමනාකල්හි, ඉං, ඉං විභක්තිය, ඉස්සං හොති, ඉස්සං යන ආදෙශවේ, තං යථා, එහි නිදර්ශනයෙක් ද, අහං පුරෙ සඤ්ඤමිස්සං සඤ්ඤාවිස්සං අනිබ්බිසං උපොසථං උපවසිස්සං, නිරයම්හි අපච්චිස්සං, අහං පුරෙ සඤ්ඤමිස්සං — පෙ — අපච්චිස්සං යනු උදාහරණයි.

(අහං, මම, පුරෙ, පෙර, සඤ්ඤමිස්සං, සංයමවූයෙමි-අනිබ්බිසං, ඒ බොධිඥානය නොලබන්නෙම්ම, සඤ්ඤාවිස්සං, ඇවිද්දෙමි — උපොසථං පෙහෙවස්, උපවසිස්සං, සමාදන්ව විසූයෙමි — නිරයම්හි, නරකයෙහි, අපච්චිස්සං, පැසුනෙමි-මෙහි "අපච්චිස්සං" හි කිවමනාකල්හි ඡන්දස්පිණිස විසංයොග කරනලදි)

97 අජ්ජතන්‍යං, අජ්ජතනියෙහි, ඉං, ඉං විභක්තිය තෙම, වා, විකල්පයෙන්, ආත්තං, ආකාරබවට පැමිණේ, තණ්හානංබ්‍යමජ්ඣගා, තණ්හානං බ්‍යමජ්ඣගා යනුවේ, එත්ථ, මෙහිවනාහි, අධිගච්ඡිං ඉති, පැමිණියෙමි යන, අත්ථො, අර්ථයි, අජ්ඣගං ඉති ච වා පන, අජ්ඣගං කියාද වේ——

98 නාම්හි, නාමිකරණයාපරනිමිත්තින්, කියාදීනං, කියාදිධාතුන්ට, රස්සො, හ්‍රස්වවේ, සංයොගෙච, සංයොගාපරකල්හිදු, ඤඤධාතුනං, සෙසුධාතුන්ගේ;

---

96 "ඉම්ස්ස මහීතෙ පජ්ජෙ අහං පුරෙසඤ්ඤමිස්සං සඤ්ඤාවිස්සං අනිබ්බිසං උපොසථං උපවසිස්සං නිරයම්හි අපච්චිස්සං" ත්ති පොත්ථකෙ,

99 ගම්ඉතො වජස්ස ඣොජ්ඣාවාසස්ස, නම්ස්සජ්ජනතිම්හි ගා
උ වාගමොවාජ්ජිම්හෙසු ධාතූනං යම්හි දීඝතා —

100 එය්‍යාය්‍යාසෙය්‍යාමෙතාතංසුච වාසෙසෙසෙතාතංසුච පා
පුණෙ
ඔකාර අය්‍යාමිතාතංසුච ආත්‍ථා පයොපාතති වාත්‍ථෙ.

---

ආසුතං, ආකාර ඊකාර ඌකාරයන්ටද, විභත්තීනං, වි
භත්තීන්ටද, මහාන්ත, මහා විභක්තීයගේ, අන්තස්සච,
අන්තයටද, රස්සතා, හ්‍රස්වබව වේ —

("කිණාති" යනු නාමිකරණයාපරනිමිත්තින් කීආදින්ට
හ්‍රස්වොදාහරණයි —"ඨස්සති – දස්සති — සුස්සති" යනු
සංයොගයා පරනිමිත්තින් ආකාරයාට හ්‍රස්වොදාහරණයි
"දිස්සති" යනු සංයොගයා පරනිමිත්තින් ඊකාරයාට හ්‍ර
ස්වොදාහරණයි "අනුභූයති" යනු සංයොගයා පරනි
මිත්තින් ඌකාරයාට හ්‍රස්වොදාහරණයි —"අපචි – පචි"
යනු විභක්තීනට හ්‍රස්වොදාහරණයි "අගම්මිනා-ගමිමිනා"
යනු මහාවිභක්තීයගේ අන්තයට හ්‍රස්වොදාහරණයි —

99 අජ්ජනතිම්හි, අජ්ජනනී විභක්තියෙහි; ගම්ඉතො, ග
මු යන ධාතුහු ගේ කාරයන්වූ; වජස්ස, වජ යන ආදෙශයාහ
ට, වා, විකල්පයෙන්; ඣොජා, ඣජ යන ආදෙශයේ;
අස්සගම්ස්ස, ගමිගමි යන ධාතූනට; ගා, ගා යන ආදෙ
ශයේ; ජ්ජිම්හෙසු, ජ්ජි මහා ත යන විභක්ති පරනිමිත්ති
න්; උම. උකාරයෙත්ද; වා, විකල්පයෙන්; ආගමො, ආග
මයේ, යම්හි, යප්‍රත්‍යයාපරනිමිත්තින්; ධාතූනං, ධාතූන්ට;
දීඝතා, දීර්ඝබව වේ —

100 එය්‍ය, එය්‍යවිභක්තියද; එය්‍යාසි, එය්‍යාසිවිභක්තිය
ද; එය්‍යාමි, එය්‍යාමිවිභක්තියද; එතාංච, එකාර බවටද;
පාපුණෙ, පැමිණෙන්නේය; සෙය්‍ය, (කාලාතිපත්ති)
සෙයවිභක්තිනට, වා, විකල්පයෙන්, එතාංච, එකාර
දෙශබවද වේ; ඔකාර, (හීය්‍යත්තනී අජ්ජතනී) ඔකාර

101 තථා බ්‍රූතො තිඅන්තීනං අළුවාහච ධාතුස්ස
පරොක්ඛායං විභත්තිම්හි අනබ්භාසස්ස දීඝතා —

102 සංයොගන්තා අකාරෙත්ථ විභත්තිප්පච්චයාදිසු
ලොප මාපජ්ජතෙ නිච්ච මෙකාරොකාරතො පරෙ.

103 සිරන්තා ආත්ත මෙය්‍යස්ස, එථාදිස්සෙය්‍යුමාදිසු
එය්‍යසද්දස්ස ලොපො වා ඣචිධාතුහි ආදිනා —

---

විභත්තීනු; අත්තං, අකාරබවටද; ඉත්තංච. ඉකාර බවට ද; ආත්ථ, (අජ්ජතනී ආත්මනෙපද) ථවිභක්තිය; (හීය ත්තනී ආත්මනෙපද) ත්ථවිභක්තිය යන මොහු; ත්ථෙ, ත්ථ එය යන ආදෙශයන්ට; වා, විකල්පයෙන්; පප්පොං නති, පැමිණෙත් —

101 තථා, එසේම; බ්‍රූතො, බ්‍රූ යන ධාතුහුකෙරෙ න්; ති අන්තීනං, ති අන්තිවිභක්තීන්ට; වා, විකල්ප යෙන්; අළු, අකාර උකාරාදෙශයෝවෙත්; පරොක්ඛා යං විභත්තිම්හි, පරොක්ෂාවිභක්තියෙහි; ධාතුස්ස, බ්‍රූධා තුහට; ආහච, ආහ යන ආදෙශදවේ; අනබ්භාසස්ස, අබ්භාසසංඥානැත්තාහට; දීඝතා, දීඝබවවේ —

102 එත්ථ, මෙහි; එකාරොකාරතො, එකාර ඔකා රයන් කෙරෙන්; පරෙ, පරවූ; සංයොගන්තො, සං යොගයා අන්තකොට ඇති; අකාරො, අකාරයතෙම; නිච්චං, අවිකල්පයෙන්; ලොපං, ලොපට; ආපජ්ජතෙ, පැමිණේ —

103 සිරන්තො, සිරප්‍රත්‍යයාන්තකෙරෙන් පරවූ; එය්‍යස්ස, එය්‍යවිභක්තිහටද, එථාදිස්ස, එථවිභක්තියගේ ආදි එ කාරයනටද; ආත්තං, ආකාරාදෙශ බවවේ; එය්‍යුං ආදි සු, එය්‍යුං යන ආදියෙහි; එය්‍යසද්දස්ස, එය්‍යශබ්දයහට; ඣචිධාතු ඉති ආදිනා, ඣචිධාතු යන ආදි සූත්‍රයෙන්; වා, විකල්පයෙන්; ලොපො, ලොපය වේ —

104 ඉච්චෙව මච්චන්ත සුසෙවනීයෙ
ධම්මෙ මුනින්දෙන සුදෙසිතෙච
විඤ්ඤූන මිච්ඡං පරමං පටුත්තං
ආඛ්‍යාත මෙතං විපුලං අභාසිං —

**ඉති රූපභෙදප්පකාසනි**

**නා මි කා ස ස ද් ද ත්ථ සා ර මෙ දි නි යා**

**ආඛ්‍යාතරූප භෙදප්පකාසනී**

**නි ට්ඨි තා.**

---

105 රූපභෙද රංසිමාලී නෙක නිච්ඡය භාණුමා
කස්සුම්මග්ගසරොරුහං කඩ්ඪඛඩ්ගසො නබොධයෙ.

---

104 ඉච්චෙවං, මෙසේ; අච්චන්ත සුසෙවනීයෙ, එකාන්තයෙන් මනාව සෙවනය කටයුතුවූ; මුනින්දෙන, මුනීන්ද්‍රයන්වහන්සේවිසින්; සුදෙසිතෙ, මොනවට දෙසනලද්දාවූ; ධම්මෙච, ධර්මයෙහිද; විඤ්ඤූනං, විඥයන්ගේ; පරමං, අතිශයවූ; නොහොත්, උතුම්වූ; පටුත්තං, ව්‍යක්තභාවය, ඉච්ඡං, කැමැතිවන්නේ; විපුලං, මහත්වූ; එතං ආඛ්‍යාතං, මේ ආඛ්‍යාතය; අභාසිං, කීමි —

මෙසේ ශබ්දශාස්ත්‍රයන්ට සාරවූ පෘථිවියවැනිවූ
රූපභෙදප්පකාසනී නම් ග්‍රන්ථයෙහි ආඛ්‍යාත
රූපභෙදප්පකාසනිය නිෂ්ඨාවී

---

105 අනෙකනිච්ඡයභාණුමා, නොයෙක්නිශ්චය නැමැති රශ්මි ඇති, රූපභෙදරංසිමාලී; රූපභෙදප්පකාසනී ග්‍රන්ථනැමැති සූර්‍ය්‍යයෙනමේ; කඩ්ඪඛණ්ඩෙසො, ශාඛා නැමැති අන්ධකාරය නසන්නේ; කස්ස, කවරෙකුගේ; උම්මග්ගසරොරුහං, ප්‍රඥානැමැති පද්මය; නබොධයෙ, ප්‍රබොධනොකරන්නේද; යරන්නේමැයි —

එගතාවතාව

106 රූපාවිමත්තාය යුත්තස්ස සද්ධම්මො සාසනං වරං
අනෙකරූපරූපෙහි විම්බෙති පසොභිතං —

107 තෙසං රූපවිසෙසානං යථා තථං පකාසතො
ඉති නාමෙන සා එසා සන්නිට්ඨාන මුපාගතා —

108 රූපභෙදප්පකාසෙන, ලොලබ්ධකුසලසඤ්චයො
තස්ස තෙජෙන සබ්බෙපි සුඛමෙධන්තු පාණිනො.

109 රූපාරූපප්පකාසස්ස රූපාරූපාතිවත්තිනො
සාසනෙ කුලපුත්තානං ඨාතෙසා සුනාඩියා —

---

එගතාවතාව, මෙතෙකින්ද;

106 රූපාවිමත්තාය යුත්තස්ස, රූපනාමයන්ගේ අවිමත්තාගුණයෙන් යුක්තවූ; සද්ධම්මො, ශාස්තෲන්වහන්සේගේ; වරං, උතුම්වූ; සාසනං, ශාසනයතෙම; විම්බෙති, අනෙකප්‍රකාරවූ; අනෙකරූපරූපෙහි, නොයෙක් ස්වරූප රූපයෙන්; පසොභිතං, හොබනේවි —

107 යථාතථං, සත්‍යවූපරිද්දෙන්; තෙසං රූපවිසෙසානං, ඒරූපවිශෙෂයන්ගේ; පකාසතො, ප්‍රකාශකාරනහෙයින්; ඉතිනාමෙන, මෙනමේ නාමයෙන් යුක්තවූ; සාඑසා, ඒ මේ රූපභෙදප්පකාසනීතොමෝ; සන්නිට්ඨානං, නිෂ්ඨාවට; උපාගතා, පැමිණුනීය —

108 රූපභෙදප්පකාසෙන, රූපභෙදයන්ගේ ප්‍රකාශකිරීමෙන්; ලොලබ්ධකුසලසඤ්චයො, යම්පුණ්‍යසමූහයෙක්; ලද්ධො, ලද්දේද; තස්ස, ඒකුශලසමූහයාගේ, තෙජෙන, තෙජසකාරණකොටගෙණ; සබ්බෙපිපාණිනො, සියලුසත්වයෝ; සුඛං, සැපෑට; එධන්තු, පැමිණෙත්වා —

109 රූපාරූපප්පකාසස්ස, රූපාරූපයන් ප්‍රකාශකරන්නාවූ; රූපාරූපාතිවත්තිනො, රූපාරූපයන් ඉක්ම

110 සත්ථණ්ණවෙ ධීචලෙන තක්කීරපූරෙ ඛිලෙ
මන්ථිතුප්පාදමණ්ඩෙන තප්පෙතා ජයතං ගරු —

111 පූජිතො රාජාධිරාජෙන මානිතො උපරූපරි
සක්කතො මහාමච්චෙන සබ්බධීරෙහි නන්දිතො —

112 ඤාණාභිවංසනාමෙන සද්දසත්ථනයඤ්ඤුනා
ධාරිතසත්ථසාරෙන ථෙරෙන අභියාචිතො —

---

ඇවැත්තාවූ සර්වඥයන් වහන්සේගේ; සාසනෙ, සස්නෙහි; කුලපුත්තානං, කුලපුත්‍රයන්ගේ; සුතබුද්ධියා, ශ්‍රුත බුද්ධිය පිණිස; එසා, මේ රූපභෙදප්පකාසනීනොමෝ; ඨාතු, පවතීවා —

110 තක්කීරපූරෙ, තර්ක නැමැති ක්ෂීරයෙන් පිරුනාවූ; අඛිලෙ සත්ථණ්ණවෙ, සියලු ශාස්ත්‍රනැමැති සාගරයෙහි; ධීඅචලෙන; ප්‍රඥානැමැති පර්වතයෙන්, මන්ථිත, මථනය කොට; උප්පාදමණ්ඩෙන, උපන්මණ්ඩයෙන්; තප්පෙතා, පිණවන්නාවූ; ගරු, (මාගේ) ආචාර්යතෙමේ; ජයතං, ජයග්‍රහණය කෙරේවා —

111 රාජාධිරාජෙන, රාජාධිරාජවිසින්; පූජිතො, පුදන ලද්දේ; උපරි උපරි, මතුමත්තෙහි; මානිතො, ආදර කරනලද්දේ; මහාමච්චෙන, මහාමාත්‍යයාවිසින්; සක්කතො, සත්කාරකරනලද්දේ; සබ්බධීරෙහි, සියලු පණ්ඩිතයන්හා, නන්දිතො, සතුටුවූයේ —

112 සද්දසත්ථනයඤ්ඤුනා, ශබ්දශාස්ත්‍ර නය දත්තාවූ; ධාරිතසත්ථසාරෙන, දරණලද ශාස්ත්‍රසාරයඇති; ඤාණාභිවංසනාමෙන, ඤාණාභිවංස නම්වූ, ථෙරෙන, ස්ථවිරයන්විසින්; අභියාචිතො, යාඥාකරනලද්දේ —

113 බොධෙබොධිසුතෙ ගාමෙ ජාතෙන ජාතියා මයා
ජම්බුධජෙනනාමෙන රචිතෙසා සුතිට්ඨිතා—

114 යථාව තිට්ඨිතා එසා නිබ්භයා නිරුපද්දවා
එවං සබ්බ ජනා ඛෙමං පප්පොන්තු නිරුපද්දවං.

115 තෙතතාලීසමෙරු රූපම්හි ඵුස්සමාසම්හි පුණ්ණමෙ
සසිවාරෙ විකාලම්හි වාචීසෙ පදවාරතො—

---

113 බොධෙබොධිසුතෙ, බොධෙබොධිනම් ප්‍රසිද්ධවූ; ගාමෙ, ගමෙහි; ජාතියා, ප්‍රතිසන්ධිජාතියෙන්; ජාතෙන, උපන් නාවූ; ජම්බුධජෙ ඉති, ජම්බුධජ යන; නාමෙන, නාම යෙන්යුක්තවූ; මයා, මාවිසින්; රචිතා, රචනාකරනලද; එසා, මේ රූපභෙදප්පකාසනීනාමෝ; සුතිට්ඨිතා, මනාකොට තිෂ්ඨාවී—

114 යථාව, යම්සේ; එසා, මේරූපභෙදප්පකාසනී නාමෝ; නිබ්භයා, භයරහිතව; නිරුපද්දවා, උපද්‍රවරහිතව; තිට්ඨිතා, තිෂ්ඨාවීද; එවං, එසේම; සබ්බ ජනා; සියලුජනයෝ; ඛෙමං, නිර්භයවූ; නිරුපද්දවං, උපද්‍රවරහිතවූ නිර්වාණයට; පප්පොන්තු, පැමිණෙත්වා—

115 තෙතතාලීසමෙරුරූපම්හි, (ශකරාජ වශයෙන්) එක්දහස් එක්සිය අසූදෙවන අවුරුද්දෙහි; ඵුස්සමාසම්හි දුරුතුමාසයෙහි; පුණ්ණමෙ, පෝණමීයෙන් යුක්තවූ; සසිවාරෙ, සඳුදිනෙහි; විකාලම්හි, විකාලයෙහි, පදවාරතො, පියවරින්; වාචීසෙ, දෙවිස්සක් ඇතිකල්හි; (නිෂ්ඨාවී)ය—

1 පුරඞ්ගසමුපෙතාය කොළඹරාජධානියා
දීපදුත්තාම නාමස්මිං විහාරෙ භුවි විස්සුතෙ—

2 ජිනනිබ්බුතියා කාස බත්ධ දීපක්ඛි සම්මිතෙ
සරදෙ සතතාභිකඞ්ඛීත් සද්ධිං වස්ස මුපාගමිං—

3 බලතානරවීරාදි සීහාවච්චස්ස පූජනීකා
ලුසීසා ෆියදෝර් මැත්දිස් වීරසීහසනාමිකා—

4 සතා ඇලැක්ෂැන්ඩර්දැබ්‍රෙව් අභයසීහනාමිනා
පච්චයෙහි උපට්ඨාසි චතූහි නිජසාමිනා—

5 එච්. ඇස්. බී. සිලවා ඛ්‍යස්ස පියාමිත්තස්ස ඤාතිනො
ජායාය මරණං සුත්වා චණ්ණුහිත්ථ මුපාගමිං—

6 අතිනාසාමාපසිං තත්‍ර දිනෙ කතිපයෙ අහං
ගන්ථස්ස කරණිච්ඡාහු අථො එත්ථන්තරෙ මම—

7 තදා මෙ දළ්හමිත්තෙන උජුචිත්තෙන විඤ්ඤුනා
සඞ්ඝතිස්ස සමඤ්ඤෙන ථෙරෙන අභියාචිතො—

8 රමෙම මරම්මදෙසම්හි බොධොධාදහි ඉභිස්සුතෙ
ගාමෙ ජාතෙන සම්බුද්ධ සාසනොදය කාරිනා—

9 ජම්බුධජාභිධථෙරෙන සද්දසත්ථඤ්ඤුනා
රූපභෙදප්පකාසනී කතා ඛ්‍යාතසංගච්ඡිනා—

10 සකලතෙරුත්තිකාන විසාභාගතුන සඤ්ඤවා
අමරපුර ගණස්ස පධාන සංඝසාමිකො—

11 අරිය වංසාලඞ්කාර නාමො විද්‍යුරබන්ධවා
උක්කාසාදි මහාභිස්ස පරනාමෙන සඤ්ඤිතො—

12 වාලුකාහිත්ථගාමස්මිං සුවිබ්‍රාහ්මණවංසජො
ඤාණතිලක විඛ්‍යාත ථෙරෙහං ථෙරසම්මතො—

13 මමන්තනවාසිනා ඤාණ වාස නාමෙන ඤාණිනා
සාමණෙරෙන සද්ධිංව සද්දසත්ථගවෙසිනා—

14 එත්ථන්තරම්හි සද්ධම්ම දෙසනත්ථං තහිං තහිං
ගම්භීගතාගතට්ඨානෙ ලිඛනෙනා නෙකසල්ලපං—

15 පුත්තාපි එත්ථ ආගම්ම යථාවුත්තාවීසි හායනෙ
කාලපක්ඛෙ ද්වාදසමෙ සාවණෙ බුද්ධවාසරෙ

16 සත්තාපහාරවෙලාය දිවා චතුදිනන්තරෙ
නිට්ඨාපෙසිං කරිත්වාන චතුබ්‍යමස්සා සවාණියා

17 අජ්ජවොමද්දවොප්පිච්ඡාසික්ඛාකාමොසුසඤ්ඤතො
සන්තුට්ඨො සීලසම්පන්නතා ;ජෙකො පාවචනෙපිච.

18 සික්ඛයී යො:සද්දසත්ථ සද්ධම්මවිනයෙ මමං
පඤ්ඤාරාම නාමො සො මහාථෙරො හි මෙ ගරු

19 සුබ්බිප්පත්වයෙ ජාතා සබ්බාසීලගුණාලයා
නාමෙනා ව්‍යවිභයා සෙනා පත්තානී ජනිකා හි මෙ.

20 සබ්බාසීලාදිසම්පන්නතා ධඤ්ඤ පුඤ්ඤ සමායුතො
පහූතධනධඤ්ඤබොධා විසුද්ධිප්පවංසජො

21 විජයකුලතිලක ඉද්ධිසීංහා ති විස්සුතො
ඛ්‍යාතායං සනාමකොරාජා මලෙවා මය්හං පිතා අහු.

22 චිරෙජා මය්හං පිතෙනසාධෙන පපිතා ඤාතිභාවතො
පබ්බජ්ජාතො හි මෙ සබ්බ කිලෙචසු උපකාරකො

23 ඉමිනා ගන්ථකරණ ජාතෙන පුඤ්ඤකම්මුනා
යං පුඤ්ඤං පසුතං බුද්ධ සාසනොදයකාරනො

24 පුඤ්ඤෙන තෙව තෙනාහං සංසාරෙ ජාති ජාතියං
ලද්ධා පණ්ඩිතසංවාසං නිච්චං පණ්ඩිත සද්ගවං

25 දුරසද්දෙ දුප්පසඟෙහා තීවගම්භීරපඤ්ඤවා
පණ්ඩිතොයෙව හුත්වාන බුද්ධො හොමි අනාගතෙ,

26 ගරූව මාතාපිතරො මිත්තා මිත්තා සුරා සුරා
ඉච්චාදයොඤ්ඤෙනාසබ්බෙත තපපොත්තු නිබ්බුති න්ති,

# ශුද්ධිපත්‍රය.

| පිට | පේළි | අශුද්ධි | ශුද්ධි |
|---|---|---|---|
| 4 | 29 | භාවිය | භාවි |
| ,, | ,, | භාවිසාශීවිය | භාවිඅශීව්‍ය |
| 9 | 2 | පබ්බතෙනවසංවජෙ | නගවේජපබ්බතෙ වසං |
| 6 | 25 | කියාදවේ | කියාහෝවේ |

# දැන්වීමයි.

1 ඒකක්ඛරකෝෂ විස්තරසන්නය.
2 ශබ්දබින්දු විස්තරසන්නය.
3 මුඛමත්තදීපනී විස්තරසන්නය 1. 2. 3. 4. 5. 6.
4 කච්චායනසාර විස්තරසන්නය.
5 කාරිකා විස්තරසන්නය.
6 ශබ්දවෘත්තිප්‍රකාශ විස්තරසන්නය.
7 ගන්ධාභරණ විස්තරසන්නය.
8 වච්චවාචක විස්තරසන්නය.
9 වාචකෝපදේශ විස්තරසන්නය.
10 විභත්‍යර්ථ විස්තරසන්නය.
11 ශාසනවංශදීප විස්තරසන්නය 1. 2. 3. 4 5. 6. 7. 8.
12 ශෘංගාරතිලක විස්තරසන්නය.
13 මෝහාවතාරය.
14 රූපභේදප්‍රකාශනී විස්තර සන්නය.
15 සාමණේරබණදහම්පොත.
16 නාමිකශබ්දමාලාව.
17 පාලිනිඝණ්ඩුව.
18 රසවාහිනී ගැටපදය.
19 සංයුත්තනිකාය.
20 අංගුත්තරනිකාය ගාථාසන්නය.

මෙම පොත් විද්‍යාරත්නාකර යන්ත්‍රාලයේ මැනේජර් වන මගෙන් පහසුගණන්වලට ලබාගත හැක.

මේවගට

කේ. ඒ. බී. මැන්ඩිස් වෛද්‍යජීවක
අප්පුහාමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු